## 1.සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය.

සන්නවේදන විෂය ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයන පාඨමාලා හඳුන්වාදීම, සන්නිවේදන විෂය කේන්ද්‍ර කොටගෙන විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම සන්නිවේදන අධ්‍යයනය යටතේ සිදු කරයි.

සන්නිවේදනය සම්බන්ධ හැදෑරීමේ ඉතිහාසය ආදි ග්‍රීක සහ රෝම යුගය දක්වා ඈතට විහිදී යයි. ප්ලේටෝ සහ සිසෙරෝ යන පඬිවරු විසූ යුගයේ දී උගන්වනු ලැබූ විෂයන් වලට ආකර්ශනීය ලෙස භාෂාව භාවිතා කිරීම(**Study of Rhetoric),** මහජන ආමන්ත්‍රණ කලාව(**Art of Oratory and Persuasion)** වැනි පාඩම් මාලා අන්තර්ගත කොට තිබුණි. මෙයින් පසක් වන්නේ සන්නිවේදනය සම්බන්ධ අධ්‍යයනවල ඉතිහාසය ආදි ග්‍රීක සහ රෝම යුගය දක්වා ඈතට විහිදී යනු ලබන බවයි.

සන්නිවේදන අධ්‍යයන විෂයක් ලෙස වර්ධනයවීමට පටන් ගත්තේ කාර්මික යුගයේ ජනමාධ්‍ය බිහිවීමත් සමගයි. පළමු සහ දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇතිවූ තත්ත්වයන් ද මෙයට බලපාන ලද අවශේෂ හේතුවක් වශයෙන් දැක්විය හැකිය. පළමු සහ දෙවන ලෝක යුද්ධ කාලවලදී සන්නිවේදන තාක්ෂණයේ සිදුවූ වේගවත් වර්ධනය ජනමාධ්‍ය බිහිවීම කෙරෙහි සහ එහි වර්ධනය සඳහා බලපාන ලදී. ලෝක යුද්ධ කාල වලදී යුධ තොරතුරු වාර්තා කිරීම සඳහා යොදාගත් සන්නිවේදන ක්‍රමවේද පශ්වාත් යුද්ධ කාලය තුළ විනෝදාස්වාදය සහ තොරතුරු සම්පාදනය සඳහා යොදා ගත්තේය. මෙම කාලයේ දී මාධ්‍ය මගින් ඉදිරිපත් කරන ලද්දේ යුධ කම්පනයෙන් පීඩාවට පත් ජනතාවගේ බිඳ වැටුණු මානසික ත්ත්වය සමනය කිරීමට ඉවහල්වන සරල වැඩසටහන්ය. එම වැඩසටහන් වල ත්‍රාසය, භීතිය, ලිංගිකත්වය මතු කරන සන්දේශ අන්තර්ගත විය. ක්‍රි.ව. 1940 – 1970 දක්වා කාලය තුළ ඉහත වැඩසටහන් වලින් ජනතාවට සිදුවන බලපෑම පිළිබඳව පර්යේෂණ කිරීමට විද්‍යාඥයන්ගේ අවධානය යොමු විය. එම කාලය සන්නිවේදන අධ්‍යයන විෂයේ ආරම්භය හා වර්ධනය සිදුවූ කාලවකවානුව වශයෙන් හැඳින්විය හැකිය.

සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය සහ වර්ධනය සඳහා ඉවහල් වූ තවත් වැදගත් සිදුවීමක් නම් ක්‍රි.ව. 1933 පමණ ජර්මනියේ නාසි පාලනය ආරම්භවීමත් සමගම විද්වත්හු රාශියක් ඇමරිකාවට පැමිණීමයි. මොවුන් අතර ඇල්බට් අයින්ටයින්, එරික් එරික්සන් වැදගත්වේ. මෙසේ පැමිණි විද්වත්හු ඇමරිකාවේ සන්නිවේදනය සම්බන්ධ අධ්‍යයන කටයුතුවල නිරතවීම සන්නිවේදන අධ්‍යයනයෙහි වර්ධනයට ඉවහල් විය. එමෙන්ම ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ ඇමරිකාණු සම්ප්‍රාප්තිය ද වැදගත්වේ. මෙම ගුරුකුලය යුරෝපයේ සිට සන්නිවේදනය ආශ්‍රිතව විවිධ අදහස් මතවාද ප්‍රකාශ කළ ගුරුකුලයකි. එමෙන්ම චිකාගෝ ගුරුකුලය ඇමරිකාවේ චිකාගෝ විශ්වවිද්‍යාලය පදනම් කරගෙන ආරම්භ වීමද මෙහිලා වැදගත්වේ. මොවුන් ප්‍රකාශ කර සිටියේ සන්නිවේදනය මූලික මානව ක්‍රියාවලියක් බවයි. දෙවන ලෝක යුද්ධය කාලයේ දී ඇමරිකාවට සංක්‍රමණය වූ විද්වතුන් ඇමරිකාවේ විශ්වවිද්‍යාලයන්හි ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රය තුළ නව අත්හදා බැලීම් සහ පර්යේෂණ දියත් කළෝය. එමගින් සන්නිවේදනය පිළිබඳ සිදුකරන ලද

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342**

අධ්‍යයන බොහොමයක් විශ්වවිද්‍යාල තුළ සිදු විය. ඒ සඳහා පුරෝගාමීවූ විද්‍යාඥයෝ කිහිපදෙනෙක් නම්,

හැරල්ඩ් ඩී. ලැස්වෙල් **(Harold D. Lasswell)**

පෝල් ලැසාස්ෆෙල්ඩ් **(Paul Lazars Feld)**

කර්ට් හවුලන්ඩ් **(Carl Hovland)**

විල්බර් ශ්‍රාම් **(Wilbur Schramm)**

එවරට් එම්. රොජර්ස්**(Everett M. Rogers)**

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

ඔවුන් විවිධ ක්ෂේත්‍ර අරභයා සිදු කරන ලද විද්‍යාත්මක පර්යේෂණ සන්නිවේදන අධ්‍යයන විෂය පෝෂණය කිරීමට ඉවහල් විය.

දේශපාලන විද්‍යාව පිළිබඳ ඇමරිකානු මහාචාර්යවරයකු වූ හැරල්ඩ් . ඩී ලැස්වෙල් මානව විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, සංඛ්‍යාන දර්ශනය ඇසුරින් සන්නිවේදනය පිළිබඳ විද්‍යාත්මක අදහස් ඉදිරිපත් කළේය.

පොල්ලැසාස්ෆෙල්ඩ් වෙළඳපොල පර්යේෂණ, මාධ්‍යවල බලපෑම පිළිබඳ පර්යේෂණ යන ආදී සන්නිවේදනය සම්බන්ධ පර්යේෂණ රාශියක් සිදු කළේය.

මෙම කාලයේ දී සන්නිවේදන අධයයනය වර්ධනය වීමට ඉවහල් වූ වැදගත් කරුණක් නම් දෙවන ලෝක යුද්ධ කාලයේ දී ඇමරිකානු හමුදාවට මානව සන්නිවේදනය පිළිබඳ ක්‍රමවත් න්‍යායක් ගොඩනැගීමට අවශ්‍ය වීමයි. මෙයින් අපේක්ෂා කරන ලද්දේ යුධ සන්නිවේදන ක්‍රියාවලිය වර්ධනය කිරීමයි. ඒ සඳහා හොව්ලන්ඩ් හමුදායතනය යොදා ගත්තේය. හොවුලන්ඩ් සමග ලුම්ස්ඩේන්**(Lumsdaine)** මර්ටන්, ලැසාස්ෆෙල්ඩ් යන අය මෙම පර්යේෂණය සඳහා එක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1949 දී "ජනසන්නිවේදනය පිළිබඳ සම්පර්යේෂණ" යන තේමාව යටතේ ජනසන්නිවේදනය හා ආකල්ප වෙනස්වීම පිළිබඳව යෙල් සරසවි වැඩසටහන ආරම්භවිය. මෙම පර්යේෂණ වැඩසටහන තවදුරටත් සන්නිවේදන විෂය ත්ෂේත්‍රය තුළ වර්ධනීය බලපෑම් සිදු කළේය.

රොබට් එස්රා පාර්ක්**(Robert Ezra Park, 1964 – 1944)** දී සන්නිවේදනය සහ සමාජ විද්‍යාව පිළිබඳව අවධානය යොමු කරමින් සන්නිවේදනය සහ එහි විද්‍යාත්මක පැතිකඩ පිළිබඳව දක්වන ලද කරුණු මෙම විෂය ක්ෂේත්‍රයේ වර්ධනයට ඉවහල් විය. එමෙන්ම එඩ්වඩ් සැපියර්**(Edward Sapir)** විසින් මානව විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ මානව සන්නිවේදනය පිළිබඳව අදහස් දක්වා ඇත.

ක්‍රි.ව.1909 දී චාර්ල්ස් හෝර්ටන්කූලි විසින් රචිත සමාජ සංවිධානය නැමැති කෘතිය වැදගත්වේ. මෙම කෘතිය මගින් සන්නිවේදනය මානව සම්බන්ධතා පවත්වා ගන්නා සහ ප්‍රවර්ධනය කරන ක්‍රමවේදයක් ලෙස අර්ථ දක්වා ඇත. එමෙන්ම මානව සම්බන්ධතා වර්ධනය සඳහා සන්නිවේදනය ඉවහල් කරගත හැකි ආකාරය පිළිබඳව ද මෙහි කරුණු දක්වා ඇත. මෙම කෘතියද සන්නිවේදන අධ්‍යයන විෂය පරාසය පුළුල් කිරීමට ඉහල්විය.

ක්‍රි.ව. 1922 දී වොල්ටන් ලිප්මාන් විසින් මහජන මතය නමින් කෘතියක් ප්‍රකාශයට පත් කළේය. මෙම කෘතිය මගින් ඔහු ජනසන්නිවේදනය තුළ සිදුවන තාක්ෂණයේ වර්ධනය අනාගතයේ මහජන ප්‍රසාදය නිපදවීමේ ක්‍රියාවලියක් ලෙසට භාවිතය ට ගත හැකි බව දක්වා ඇත.

ක්‍රි.ව.1927 දී ජෝන්ඩූවි ඔහුගේ මහජනතාව සහ ඔහුන්ගේ ගැටලු(**The Public and it's Problems**) නැමැති කෘතියෙන් අනාවරණය කර ඇත්තේ සමාජය සුභවාදී පරිවර්තනයකට ලක් කරමින් උසස් සමාජයක් බිහිකිරීමට සන්නිවේදනයට හැකියාව ඇති බවයි. එමෙන්ම සියළු කටයුතු අතර සන්නිවේදනය ආශ්වර්යමත්ව පවතින බව දක්වා ඇත. මෙයින් ගම්‍යවන්නේ සන්නිවේදනයේ වර්ධනය සියළු ක්ෂේත්‍රවල වර්ධනයට ඉවහල්වන බවයි.

සන්නිවේදනය පිළිබඳව ඉහත ආකාරයෙන් නිර්වචන සිදුකර තිබුන ද එය ශාස්ත්‍රීය විෂයක් ලෙස වර්ධනය වීමට පටන් ගත්තේ කොලොම්බියා විශ්වවිද්‍යාලය, චිකාගෝ විශ්වවිද්‍යාලය, ඉලනොයිස් විශ්වවිද්‍යාලය යන ඇමරිකාණු උසස් අධ්‍යාපන ආයතන තුළ අධ්‍යයන අංශයක් විවර වීමත් සමගයි. මේ සඳහා පුරෝගාමී වූ විද්‍යාඥයෝ කිහිප දෙනෙකි.

හැරල්ඩ් ඩී. ලැස්වෙල් (**Harold D. Lasswell**)

පෝල් ලැසාස්ෆෙල්ඩ් (**Paul Lazars Feld**)

විල්බර් ශ්‍රාම් (**Wilbur Schramm**)

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

ක්‍රි.ව. 1944 දී කොලොම්බියා විශ්වවිද්‍යාලයේ දී පෝල් ලැසාස්ෆෙල්ඩ් (**Paul Lazars Feld**) විසින් ආරම්භ කරන ලද ව්‍යවහාරික සමාජ පර්යේෂණ ඒකකය(**Bureau of Applied Social Research**) විසින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පුළුල් කිරීමට විවිධ පර්යේෂණ සිදු කළේය. එමෙන්ම ඔහුගේ සමසංස්කරණයෙන් එළි දැක්වුනු පුද්ගල බලපෑම පිළිබඳ පර්යේෂණ වාර්තා මගින් මාධ්‍ය මගින් සිදුවන බලපෑම පිළිබඳව කරුණු අනාවරණය කළේය. මෙම පර්යේෂණය හරහා සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පුළුල් පරාසයකට ගෙන ගියේය.

ක්‍රි.ව.1940 න් පසුව චිකාගෝ විශ්වවිද්‍යාලය තුළ ඇරඹුණු කමිටු සන්නිවේදන විෂය ක්ෂේත්‍රය නවතම දිශානතියකට රැගෙන ගියේය. එම සන්නිවේදන කමිටු වල හැරල් ඩී. ලැස්වෙල්, ඩග්ලස් වැපල්ස්, සැමුවෙල් ඒ ස්ටව්ෆර්, ලුවිස් රීත්, හර්බට් ලුවර් සන්නිවේදන අධ්‍යයන සඳහා පුරෝගාමී

මෙහෙවරක් සිදු කරන ලදී. මෙම කමිටුව මගින් සන්නිවේදන අධ්‍යයන ක්‍රියාවලිය සන්නිවේදනය නමින් සංකල්පගත කෙරිණි.

චිකාගෝ විශ්වවිද්‍යාලයේ යුධ තොරතුරු සඳහා ඇරඹුණු පර්යේෂණ ඒකකය ක්‍රි.ව. 1947 සහ 1960 දී හච්සන් කොමිසමේ කටයුතු සඳහා ඉවහල් කර ගත්තේය. මෙමගින් පසු කාලයේ දී සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට අදාලව උපාධි ප්‍රධානය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළේය.

බර්නාඩ් බෙරල්සන් සහ ජැනොවිට්ස් යන විද්වතුන් විසින් ක්‍රි.ව. 1970 පළ කරන ලද ජනමතය, ජනසන්නිවේදනය, මහජන සන්නිවේදනය යන අධ්‍යයන මෙම අධ්‍යයන ක්ෂේත්‍රයට සුවිශේෂී බලපෑමක් සිදු කළේය.

ක්‍රි.ව.1947 දී විල්බර් ශ්‍රාම්ගේ මූලිකත්වයෙන් ඉලිනොයිස් විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සඳහා අංශයක් ආරම්භ කළේය. එමෙන්ම ඔහුගේ ජනසන්නිවේදනයේ ක්‍රියාවලිය හා බලපෑම නම්වූ කෘතිය වැදගත්වේ. මෙම අධ්‍යයන මගින් ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රය පුළුල් විය.

ඇමරිකාව කේන්ද්‍ර කොටගෙන සිදු කරන ලද සන්නිවේදන අධ්‍යයන මෙහිදී වැදගත්වේ. විශේෂයෙන්ම සන්නිවේදනයේ බලපෑම පිළිබඳව පර්යේෂණ රාශියක් ඇමරිකාව කේන්ද්‍ර කොටගෙන සිදු විය. මාර්ෂල් මැක්ලුහාන් ක්‍රි.ව. 1964 දී පල කරන ලද මාධ්‍ය වටහා ගැනීම **(Understanding Media)** කෘතිය මගින් ඔහු අනාවරණය කරන ලද්දේ සන්නිවේදනය මානව ඉතිහාසයේ තීරණාත්මක භූමිකාවක් ඉටු කරනු ඇති බවයි. එමෙන්ම සන්නිවේදනය වර්ධනයවීමත් සමගම සිදුවන සමාජ වෙනස්වීම ලෝකය විශ්ව ගම්මානයක් බවට පරිවර්තනය කිරීමට හේතුවන බව පැහැදිළි කොට ඇත.

මෙයට අමතරව ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් විසින් ගොඩනගන ලද සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ද සන්නිවේදන ක්ෂේත්‍රය අධ්‍යයන විෂයක් බවට පත්වීමට ඉවහල් විය.

මුල් කාලයේ දී සන්නිවේදන අධ්‍යයන විෂය පුළුල්වීම සඳහා සමාජ විද්‍යාව, මානව විද්‍යාව ආදී විෂය ක්ෂේත්‍ර රාශියක් බලපාන ලදී.

සන්නිවේදන අධ්‍යයනය විශ්වවිද්‍යාල ශික්ෂණයක් ලෙස ක්‍රි.ව. 1930 ඇමරිකාවේ ස්ටැන්ෆර්ඩ් අයෝවා සරසවියේ ආරම්භවීමට පෙර මානව විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රවල සිදු කරන ලද පර්යේෂණ වලින් පෝෂණය විය. මෙම කාලයේ දී චාල්ස් හෝර්ටන්කූලි, රොබට් එස්රා පාර්ක් හා එඩ්වඩ් සැපීර් යන විද්‍යාඥයින් සිදු කරන ලද පර්යේෂණ මෙහිලා වැදගත් විය.

මෙයට අමතරව තවත් විවිධ ක්ෂේත්‍රවලට අයත් විද්‍යාඥයන් විසින් සිදු කරන ලද අධ්‍යයන ද මෙම විෂය ක්ෂේත්‍රය වඩාත් විද්‍යාත්මක විෂයක් බවට පත්වීමට ඉවහල් විය.

විල්බර්ශ්‍රාම් විසින් ඉලනොයිස් සරසවිය කේන්ද්‍ර කොටගෙන සන්නිවේදන පර්යේෂණ ආයතනයක් බිහි කරන ලද අතර මෙම ආයතනයේ සන්නිවේදනයට සම්බන්ධ අධ්‍යයන රාශියක් සිදු කළේය. මෙම විශ්වවිද්‍යාලය සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වූ පළමු විශ්වවිද්‍යාලයයි.

ක්‍රි.ව.1955 දී මිචිගන් සරසවියේ ආරම්භ වූ සන්නිවේදන අංශය වැදගත්වේ. මෙය ඩේවිඩ් බර්ලෝගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ අතර සමාජ විද්‍යාත්මක පදනමින් සන්නිවේදනය ඉගැන්වීම් කටයුතු ද සිදු කළේය.

විසිවන ශතවර්ෂය වන විට සන්නිවේදනය පිළිබඳව ලෝකයේ නන්දෙස විවිධ ආකාරයේ පර්යේෂණ සිදු විය. එමෙන්ම එකල විවිධ පර්යේෂණ ආයතන වලින් සිදු කරන ලද පර්යේෂණ වල තොරතුරු වෙන්වෙන් වශයෙන් පැවැතුනි. ක්‍රි.ව. 1949 දී ලෝකයේ සන්නිවේදනයට සම්බන්ධ සියළු විද්වතුන් ඒකරාශී කිරීමේ අරමුණින් එල්වුඩ්මරේ විසින් "ජාත්‍යන්තර සන්නිවේදන සංගමය" ආරම්භ කරන ලදී. එමගින් මෙතෙක් විසිරී පැවැති දැනුම ඒකරාශිවීම සිදුවිය. එයද සන්නිවේදනය සම්බන්ධ විෂය පුළුල් වීමට ඉවහල් වූ කරුණකි.

පොල් ලැසාස්ෆෙල්ඩ් විසින් පුද්ගලාන්තර සන්නිවේදනය සහ ජනසන්නිවේදනය අතර සම්බන්ධතාව පිළිබඳව පුළුල් පර්යේෂණ සිදු කිරීම නිසා සන්නිවේදන විෂය විද්‍යාත්මක විෂයක් බවට පත්විය.

මෙහිදී වැදගත්වන්නේ තෝමස් ක්ලැපර් විසින් සිදු කරන ලද අධ්‍යයනයි. ඔහු පුද්ගලයන්ගේ ආකල්ප සහ චර්යාව වෙනස් කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කරන ලද අතර එම පර්යේෂණ වලදී අනාවරණය වූයේ ඉහත කාර්යයන් සඳහා සන්නිවේදනය සාර්ථකව භාවිත කළ හැකි බවයි.

ක්‍රි.ව. 1930 දී සන්නිවේදන විෂය ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගෙන සාම්ප්‍රදායික ආකෘතියෙන් මිදුනු පර්යේෂණ කිහිපයක් සිදු විය. මෙම පර්යේෂණ මගින් සන්නිවේදනය සඳහා සංඛ්‍යානයේ වැදගත්කම පෙන්වා දුන්නේය.

ක්‍රි.ව. 1970 දී යුරෝපයේ සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රයේ ව්‍යාප්තියක් සිදුවිය. මෙහිදී එංගලන්තයේ ලෙස්ටර් සරසවියේ ජේම්ස් හැලොර්න් ඇමරිකානු ආකෘතියෙන් මිදී යුරෝපීය ක්‍රමවේදයකට අනුකූලව සන්නිවේදන විෂය ඉදිරියට ගෙන යෑමට ගත් ප්‍රයත්නය ද සන්නවේදන අධ්‍යයන විෂය පුළුල් වීමට ඉවහල් විය. මෙයට අමතරව එංගලන්තයේ සන්නිවේදන අධ්‍යයන විෂය පුළුල්වීම සඳහා සිටි විශ්වවිද්‍යාලය, වේල්ස් සරසවිය, බකිම්හැම් යන විශ්වවිද්‍යාල තුළ සිදු කරන ලද අධ්‍යයන ඉවහල් විය.

මහාචාර්ය විල්බර්ශ්‍රාම් විසින් රූපවාහිනය පිළිබඳව සිදු කරන ලද ප්‍රථම පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරමින් ඔහු ප්‍රකාශකර සිටියේ ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස්වීම හා රූපවාහිනිය භාවිතය අතර සමීප සම්බන්ධයක් පවතින බවයි. දෙමවුපියන් සමග අඬදබර කරගන්නා දරුවන් තම නොරිස්සුම් සහගත හැඟීම් වලින් පලා යාමට සිත් වේදනාවන් අමතක කර ගැනීමට රූපවාහිය නැරඹීමට යොමුවන බව සිය පර්යේෂණ මගින් පෙන්වා දෙන ලදී.

එමෙන්ම ක්‍රි.ව. 1950 දී වැඩීගෙන එන රූපවාහිනිය ළමයින්ගේ සහ තරුණයන්ගේ ප්‍රචණ්ඩත්වයට බලපාන ආකාරය පිළිබඳව විල්බර්ශ්‍රාම් බර්නාඩ් බෙරල්සන්ගේ කෘතියක කරුණු දක්වා ඇත. එමගින් ඔහු දක්වා ඇත්තේ මාධ්‍ය පුද්ගලයාට හුදකලාව නොව සමාජීය පොදු කාරණාවක් ලෙස බලපාන බවයි.

එමෙන්ම පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායමක් විසින් සිදු කරන ලද පර්යේෂණය වැදගත්වේ. ප්‍රචණ්ඩකාරී ක්‍රියා සහිත සහ රහිත රූපවාහිනී කාටුන් වැඩසටහන් ළමයන් කණ්ඩායම් දෙකකට නැරඹීමට ලබා දීමෙන් මෙම පර්යේෂණය සිදු කළ අතර, මෙම පර්යේෂණය විල්බර් ශ්‍රාම් විසින් සිදු කරන ලද පර්යේෂණයේ කරුණු තහවුරු කිරීමට සමත්විය. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ රූපවාහිනියේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා ළමයින් තුළ වෙනස්කම් කිහිපයක් සිදු වන බවයි.

<u>වේදනාත්මක දේ පිළිබඳව ළමයින්ගේ සංවේදීතාවය අඩුවීම.</u>

ප්‍රචණ්ඩකාරී දර්ශන සහිත කාටූන් චිත්‍රපට වල අන්‍යොයන්ට සිදු කරන හානි සහිත දර්ශන නිරන්තරයෙන් නැරඹීම මගින් ඒවා දරුවන් අභ්‍යන්තරීකරණය කර ගන්නා අතර මෙම සිදුවීම් ලෝකයේ සිදු වන සාමාන්‍ය සිදුවීම් ලෙස උපකල්පණය කොට ගනියි. මෙහිදී යථා ලෝකයේ මෙවැනි ක්‍රියා සිදුවීම දරුවා තේරුම් ගන්නේ සාමාන්‍ය සිදුවීම් ලෙසයි.

<u>තමා ජීවත්වන පරිසරය සහ අවට ලෝකය පිළිබඳව බියක් ඇති කර ගැනීම.</u>

ප්‍රචණ්ඩකාරී දර්ශන සහිත කාටූන් චිත්‍රපටවල සිටින ප්‍රධාන චරිතයට නිරන්තරයෙන්ම හානි පැමිණෙන්නේ සමීපතමයන්ගෙන් හෝ සමීප පිරිසරයනි. නිතර මෙම දර්ශන නැරඹීමෙන් දරුවන් තුළ යථා ලෝකයේ ද මෙවැනි අනාරක්ෂිත බවක් පවතින්නේය යන විශ්වාසයක් ඇති කර ගනියි.

<u>අන්අය සමග කටයුතු කිරීමේ දී ආක්‍රමණකාරී සහ ගැටලුකාරී තත්ත්වයන් වලට නැඹුරුවීම.</u>

ප්‍රචන්ඩකාරී දර්ශන සහිත කාටූන් චිත්‍රපට වල සමීප සබඳතාවයන් මිත්‍රශීලී භාවයෙන් යුතුව කටයුතු කිරීම් අන්‍යොයන් අගය කිරීම් යන උත්තරීතර මානුෂික ගුණාංග නොමැත. ඒ වෙනුවට ඒවා සතුරු සබඳතාවයන් වලින් පිරී පවතී. මේවා අභ්‍යන්තරී කරගන්නා දරුවන් සාමාන්‍ය ජීවිතයේ ස්වකීය සමීපතමයන් මෙවැනි පිරිසකැයි යන උපකල්පනය මත හිදිමින් කටයුතු කරයි.

විල්බර් ශ්‍රාම් ස්ටැන්ෆර්ඩ් හි ගත කළ අවධිය තුළ රූපවාහිනිය ළමයින්ගේ ප්‍රචන්ඩත්වය කළහකාරිත්වය සඳහා **(Violence /Aggression)** බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයන ගණනාවක් සිදු කර ඇත. **(Television in the Lines of Our Children – Schramm Lyle Parker,1961).** මෙයට අමතරව මානසික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපන ආයතනය**(NIMA)** සමග එකතුව වෙළුම් ගණනාවකින් යුතු රූපවාහිනී ප්‍රචන්ඩත්වය පිළිබඳව කෘතියක් ක්‍රි.ව. 1972 දී ප්‍රකාශයට පත් කළේය. මෙහිදී "රූපවාහිනිය ළමයින් කෙරෙහි බලපානු ලබන ආකාරය" පිළිබඳව අධ්‍යයනය කල අතර මෙම පර්යේෂණය සඳහා මනෝ විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින් අධ්‍යාපනඥයින් රාශියක් සම්බන්ධ විය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට ඇමරිකාවේ බලපෑම පිළිබඳව විශ්ලේෂණ කිරීමේ දී **AEJMC – Association for education in journalism and mass communication** යන ආයතනය වැදගත්වේ. ඇමරිකාවේ සියළුම විශ්වවිද්‍යාල වල සන්නිවේදනය හා පුවත්පත් කලා පාඨමාලා පරික්ෂා කොට අදාල අනුමැති සහතික පත් නිකුත් කරන්නේ මෙම ආයතනය මගිනි. එයට අමතරව විවිධ ප්‍රකාශන, වාර්ෂික සම්මේලන ආදිය මගින් සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය කිරීමට වාර්ෂික සමුළු සංවිධානය කරයි. එම සමුළු වලදී විද්වත් කථිකාවන් පර්යේෂණ මගින් අත්කරගත් තොරතුරු පිළිබඳව සාකච්ඡා කරයි. මෙමගින් සන්නිවේදන විෂය පෝෂණය වීමට ඉමහත් බලපෑමක් සිදුවේ.

එමෙන්ම ජනසන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පුළුල්ව වර්ධනයවීම සඳහා විසිවන සියවසේ විද්‍යාඥයන් කිහිප දෙනෙකුම පුරෝගාමී විය. චාර්ල්ස් හෝර්ටන් කූලි**(Charles Horton Cooley)** වොල්ටර් ලිප්මාන්**(Walter Lippman)** ජෝන්ඩේවි**(John Dewey)** වැදගත්වේ. එමෙන්ම මෙහිදී ක්‍රි.ව. 1909 දී චාල්ස් කූලිගේ සමාජ සංවිධානය නැමැති කෘතියද ක්‍රි.ව. 1922 වොල්ටර් ලිප්මාන්ගේ ජනමතය කෘතිය ද ක්‍රි.ව. 1927 දී ජොන්ඩූවිගේ ජනතාව සහ ඔවුන්ගේ ගැටලු කෘතිය ද සන්නිවේදන අධ්‍යයන විෂය පෝෂණය කළේය.

විල්බර්ශ්‍රාම් විසින් ෆෝල් ලැසාස්ෆෙල්ඩ්, හැරල් ඩී. ලැස්වෙල්, කාල් හවුලන්ඩ් හා කාට් ලෙවින් සන්නිවේදනයට අදාලව ගොඩ නගන ලද දැනුම විධිමත්ව සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට

අන්තර්ගත කළ හෙයින් ඔහු සන්නිවේදන අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ පියා වශයෙන් සලකණු ලබයි.

එමෙන්ම විල්බර් ශ්‍රාම්ගේ සන්නිවේදන විද්‍යාව යන කෘතිය මගින් සන්නිවේදනය විෂය ක්ෂේත්‍රය නව දිශානතියකට රැගෙන ගියේය. එමෙන්ම ඔහු විශ්වවිද්‍යාල තුනක ගොඩ නගන ලද සන්නිවේදන ආයතන සන්නිවේදන ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනයක් සිදු කළේය. ඉලිනොයිස් විශ්වවිද්‍යාලයට අනුබද්ධ සන්නිවේදන පර්යේෂණ ආයතනය, ස්ටැන්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයට අනුබද්ධ පර්යේෂණ ආයතනය, හොනලුලු විශ්වවිද්‍යාලයට අන්බද්ධ ඊස්ට්වෙස්ට් සන්නිවේදන ආයතනය යන ආයතන සන්නිවේදන විෂය පථය පුළුල් කළේය.

නව තාක්ෂණයේ වර්ධනයත් සමගම සන්නිවේදන විෂය පථය ද පුළුල් වූ අතර එතුළින් සමාජයට සිදු කරනු ලැබූ බලපෑම ද සංකීර්ණ විය. මෙම බලපෑම සමාජ මනෝ විද්‍යාඥයන් විසින් විශ්ලේෂණය කිරීමත් සමගම සන්නිවේදනය හා බැදුනු සුවිශේෂී සන්නිවේදන න්‍යාය සහ ආකෘති රැසක් බිහිවිය. එතුළින් සන්නිවේදනය අධ්‍යයනය ස්වාධීන විෂයක් බවට පත්විය.

20 සියවසේ දී ඇමරිකාණු සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට දැඩි බලපෑමක් සිදු කරන ලද සිවු දෙනෙකු ලෙස ජොන් ඩේවි, චාල්ස් හෝර්ටන් කූලි, රොබට් ඊ පාක්, ජොර්ජ් හර්බට් මීඩ් වැදගත්වේ. පණිවුඩයක් සංජානනය කිරීම පුද්ගල නිශ්‍රිත භාවයන්ගෙන් යුත් ක්‍රියාවක් බව පෙන්වා දුන්නේය. එමෙන්ම සන්නිවේදන ක්‍රියාවලියේ දී පුද්ගලයා අතිශය වැදගත්වන බවද පෙන්වා දුන් වැදගත් කරුණකි. එමෙන්ම පණිවිඩයක් තේරුම් ගැනීම අර්ථකථනය කිරීම තනිකරම පුද්ගලයාගේ මනෝභාවයන් මත පදනම් වන බව පෙන්වා දුන්නේය.

ක්‍රි.ව. 1998 ජූනි 14 දින ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් නුවර දී යුරෝපීය සන්නිවේදන ආයතනය පිහිටුවන ලදී(**European Journalism Training Association).** මෙම ආයතනය යුරෝපයේ අති සියළුම පුවත්පත් කලා ආයතන වෙනුවෙන් පෙනී සිටියි. එමෙන්ම විෂය මාලා සංවර්ධනය ද සිදු කරණු ලැබේ.

ආසියාවේ සන්නිවේදන අධ්‍යයන කටයුතු ව්‍යාප්තවූයේ ඇමරිකාණු ආකෘතියට අනුවයි. පිලිපීනයේ පිලිපීන රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන ආයතනය ඇමරිකාණු ආකෘතිය පමණක් නොව පොත්පත් ද ආසියාව පුරා ව්‍යාප්ත කිරීම නිසා ආසියාවේ ද සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රය ව්‍යාප්ත විය.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය අද වන විට ලොව රටවල් ගණනාවක ඉතාමත් ජනප්‍රිය විෂයක් බවට පත්වී තිබේ. එය බොහෝ විෂය ක්ෂේත්‍ර ඇසුරු කරගෙන අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදු කරයි. සන්නිවේදන පර්යේෂණ වර්තමානයේ දී ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද මත පදනම් වී ඇත.

ඩිජිටල් අංකිත මාධ්‍යයේ බිහිවීමත් සමගම මාධ්‍ය හා පරිගණක තාක්ෂණය මුසුවීමෙන් එම මාධ්‍ය වල බලපෑම හා සන්නිවේදන චර්යාව අධ්‍යයන කිරීම මෙන්ම එම නව මාධ්‍ය වැඩසටහන්, සමාජ ජාල, බ්ලොග්, වෙබ් අඩවි, චිප්, ජංගම දුරකථන, ස්මාට්ෆෝන්, ටැබ් යන්ත්‍ර ඔස්සේ ගොඩනැගෙන සන්නිවේදනය පිළිබඳව පර්යේෂණ සිදු කරයි. මෙම සන්නිවේදන පර්යේෂණ ක්‍රමයෙන් කෘතිම බුද්ධිය, ස්නායු විද්‍යාව,ප්‍රජානන විද්‍යාව හා බද්ද වෙමින් සිදුවේ. එම සන්නිවේදන අධ්‍යයන බොහෝ විට සමීපවන්නේ විද්‍යාවකට හෝ කලාවකට වඩා වෙනස්වන ශික්ෂණයකට බව ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලුසියානෝ ෆ්ලොරිඩ්(**Luciano Floride**) ප්‍රකාශ කර ඇත. එමෙන්ම මේ පිළිබඳව කැලිෆෝනියා සරසවියේ ඇනන්බර්ග් සන්නිවේදන පාසලේ මහාචාර්ය මැනුවෙල් කැස්ටෙල්ස් (**Manuel Castells**) ද කරුණු දක්වා ඇත.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රය ශාස්ත්‍රීය විෂයක් ලෙස හැදෑරීමෙන් ඇති කරගත හැකි නිපුණතා.

මුල් කාලයේ දී සන්නිවේදනය සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාන විද්‍යාව, ආර්ථික විද්‍යාව යන ආදී විවිධ විෂය ක්ෂේත්‍ර මගින් පෝෂණය විය.

පසු කාලීනව විවිධ විෂය ක්ෂේත්‍ර වලට අයත් විද්‍යාඥයන් විසින් සිදු කරන ලද විද්‍යාත්මක පර්යේෂණ වල ප්‍රතිඵලයක් ලෙස ජනසන්නිවේදන විෂය ස්වාධීන විෂයක් බවට පත්විය. එයට අමතරව පළමු සහ දෙවන ලෝක යුද්ධ වලදී යුධ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා නව සන්නිවේදන ක්‍රමවේද සොයා ගත්තේය. මෙම සන්නිවේදන ක්‍රමවේද පශ්චාත් යුධ සමය තුළ සාමාන්‍ය ජනතාවගේ විනෝදාස්වාදය තොරතුරු සම්පාදනය සඳහා යොදා ගැනීමෙන් සන්නිවේදනය තව දුරටත් වර්ධනය විය. ජනමාධ්‍ය වර්ධනය වීමත් සමගම ඒවායින් පුද්ගලයාට සහ සමාජයට විවිධ බලපෑම් සිදුවූ අතර මෙම බලපෑම් පිළිබඳව විවිධ ක්ෂේත්‍ර වලට අයත් විද්වතුන් විසින් පර්යේෂණ සිදු කරන ලදී. මෙම පර්යේෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රය විද්‍යාත්මත දෘෂ්ටිකෝණයක් මත පදනම් වෙමින් අධ්‍යයන විෂයක් බවට පත්විය. මෙහිලා විවිධ විශ්වවිද්‍යාල කේන්ද්‍ර කොටගෙන සිදු කරන ලද පර්යේෂණ හා හඳුන්වාදෙන ලද පාඨමාලා වැදගත්වේ.

වර්තමානයේ දී ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රය විද්‍යාත්මක පර්යේෂණ මත පදනම් වූ විෂයක් බවට පත්වී තිබේ. එමෙන්ම ජනමාධ්‍යයේ වර්ධනය වීමට සාපේක්ෂව සන්නිවේදන පර්යේෂණ

ක්ෂේත්‍රයද වේගවත්ව වර්ධනය වේ. එම නිසා සන්නිවේදන විෂය ක්ෂේත්‍රය විද්‍යාත්මක සංකල්ප මත පදනම් වූ අධ්‍යයන විෂයක් බවට පත්වී ඇත.

විද්‍යාර්ථයකුට සන්නිවේදන අධ්‍යයන විෂය ප්‍රගුණ කිරීමෙන් පහත සඳහන් ශක්‍යතා වර්ධනය කරගත හැකිවේ.

1. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය රාශියක් ක්‍රියාත්මක වේ. මෙම මාධ්‍ය ප්‍රධාන වශයෙන් රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය වශයෙන් ආකාර දෙකක් යටතේ විග්‍රහ කළ හැකිය.

රාජ්‍ය මාධ්‍ය බොහෝ විට පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති, ආකල්ප, අදහස් සමාජගත කිරීම සඳහා යත්න දරයි. මෙම මාධ්‍ය තුළ බොහෝ විට අතිශයෝක්තිය ගැබ්වූ වැඩසටහන් දැකිය හැකිය. ආයතන වල දෙපාර්තමේන්තු වල සිදු වන අක්‍රමිකතා, දූෂණ ආදිය හෙලිකරනු වෙනුවට ඒවා ජනතාවගෙන් වසන්කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්, ප්‍රතිපක්ෂවල මතවාද නිශේධනය කරන වැඩසටහන් සමාජ ගත කිරීමට ප්‍රයාශ කරයි. එයට අමතරව දේශපාලන ප්‍රතිරූප ඔසවා තැබීම පිණිස මාධ්‍ය වැඩසටහන් දියත් කරයි. සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රය මනාව හැදැරීමෙන් මෙවැනි මාධ්‍ය සන්දේශ පිළිබඳව අන්තර්ගත විශ්ලෙශ්ෂණයක යෙදිය හැකි අතර එතුළින් එකී මාධ්‍යයේ සන්නිවේදන ආකෘතිය පිළිබඳව මනා වටහා ගැනීමක් ලබා ගත හැකිවේ.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය පිළිබඳව විශ්ලේෂණය කිරීම වැදගත්වේ. මෙම මාධ්‍යවල මූලික අභිලාෂය වන්නේ අවම පිරිවැයකින් උපරිම ලාභය ලබා ගැනීම සහ මාධ්‍ය හිමිකාරිත්වයේ භූමිකාව සමාජගත කිරීමයි. මේ සඳහා අවරගනයේ වැඩසටහන්, විවිධ ත්‍යාග මුදල් ආදිය ලබාදීම තුළින් මහජනතාව සිය නාලිකාව වෙත පොලඹවා ගැනීම සිදු කරයි. එමෙන්ම හිමිකරුවාගේ දේශපාලන දෘෂ්ටිය විවිධ වැඩසටහන් මගින් ජනතාවට එන්නත් කිරීමට පෙළඹේ. මෙවැනි මාධ්‍යවල ක්‍රියාකාරිත්වය පිළිබඳව මනාව වටහා ගැනීමට නම් සන්නිවේදන අධ්‍යයන විෂය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

ජාත්‍යන්තර වශයෙන් පවතින තත්ත්වය මෙයට හාත්පසින්ම වෙනස්වේ. වර්තමානයේ ජාත්‍යන්තර බහුජාතික සමාගම් කිහිපයක් විසින් ලෝකය වෙලා ගෙන ඇත. මෙම බහුජාතික සමාගම් වලට විශාල ප්‍රමාණයේ ගුවන් විදුලි නාලිකා, රූපවාහිනී නාලිකා, දුරකථන සමාගම්, ප්‍රවෘත්ති පත්‍ර අයත්ය. මෙම ආයතන වලින් නිෂ්පාදනය කරන මාධ්‍ය නිෂ්පාදනයන් ජනතාවට අලෙවි කිරීම සඳහා සන්දේශ ජනතාවට එන්නත් කරයි. මෙවැනි සමාගම් වලට නිදසුන් ලෙස ටයිම් වොර්නර් මාධ්‍ය සමාගම, වොල්ට් ඩිස්නි සමාගම, බර්ටෙල්ස්මන් සමාගම, සෝනි සමාගම වියකොම් සමාගම නිදසුන් ලෙස දැක්විය හැකිය. මෙම සමාගම් වලින් එලි දක්වන මාධ්‍ය

නිෂ්පාදන පිළිබඳව හා හිමිකාරිත්වයේ භූමිකාව පිළිබදව යථා අවබෝධයක් සන්නිවේදන විෂය පුළුල්ව අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකිය.

සමාජය තුළ විවිධ කණ්ඩායම් ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස ආගමික කණ්ඩායම්, මතවාදී කණ්ඩායම්, අවිහිංසාවාදී කණ්ඩායම්, ත්‍රස්තවාදී කණ්ඩායම් දැක්විය හැකිය. මෙම කණ්ඩායම් ස්වකීය මතය සමාජ ගත කිරීමටත්, තමන්ගේ සමාජිකයන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීමටත් රැස්වීම්, සම්මන්ත්‍රණ, සමාජ මාධ්‍ය භාවිතා කරයි. ඇතැම් කණ්ඩායම් වල මතවාද සමාජයට හිතකර වන අතර ඇතැම් ඒවා අහිතකර වේ. මෙම කණ්ඩායම් මගින් ලබා දෙන ප්‍රචාරණ ක්‍රමවල සත්‍යතාව අවබෝධ කර ගැනීමට මෙම විෂය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

**2.** <u>විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය.</u>

ජනමාධ්‍ය වල සමාන ආකෘතියේ වැඩසටහන් පිරී පවතී. විවිධ රූපවාහිනී නාලිකාවල සමාන ආකෘතියේ ටෙලි නාට්‍ය රාශියක් විකාශය වේ. එමෙන්ම විවිධ ගුවන් විදුලි නාලිකා වල සමාන සංගීත වැඩසටහන් විකාශය වේ. එමෙන්ම සමාන ආකෘතියේ ප්‍රවෘත්ති, විශේෂාංග, ප්‍රවෘත්ති ආදිය දැකිය හැකිය. මෙහිදී පුද්ගලයාගේ අභිමතයට රුචිකත්වයට අනුව වැඩසටහන් තෝරා ගැනීමට යෑමේ දී බොහෝ විට මාධ්‍ය පරිශීලකයා අපහසුතාවයට පත්වේ. නමුත් සන්නිවේදන විෂය පථය ප්‍රගුණ කළ පුද්ගලයා වැඩසටහන් තෝරා ගැනීමට ප්‍රථම එහි පාඨ, සංගීතය, පෙළ ආදිය විශ්ලේෂණය කොට තමාට සුදුසු වැඩසටන තෝරා ගනියි.

**3.** <u>අවශ්‍ය අදාළ තොරතුරු තෝරා ගැනීමේ හැකියාව.</u>

ජනමාධ්‍ය නිරන්තරයෙන්ම පුද්ගලයා මුලාවට පත් කරයි. යථාර්ථයෙන් මායාවට කැදවාගෙන යයි. පුද්ගලයා පොළඹවා ගැනීම සඳහා මෙම මාධ්‍ය පුද්ගලයාගේ භාවයන් උද්දීපනය කරයි. උදා: ආදරය, බිය, සැකය ආදි භාවයන් මධ්‍ය බහුලව භාවිත කරයි. ජනමාධ්‍ය සන්දේශ තුළට මෙම භාවයන් උද්දීපනය වන ආකාරයේ පාඨ, සංගීතය, රූප ඇතුලත් කරයි. ඒවා නරඹන, කියවන පුද්ගලයන් මුලාවට පත්වේ. එසේ මුලා කොට මාධ්‍ය තමන් වෙතට ජනතාව ආකර්ශනය කර ගනියි. මෙමගින් පුද්ගලයා සන්දේශ තුළ මුලාවට පත්වේ. මාධ්‍යවල වහලෙකු බවට පත්වේ. මෙසේ මාධ්‍ය මගින් සිදු කරන මුලාවෙන් මිදී අවශ්‍ය තොරතුරු පමණක් තෝරා ගැනීම සඳහා සන්නිවේදන විෂය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

**4.** ගවේෂණශීලීත්වය විචාරශීලී චින්තනය දියුණුවීම.

ජනමාධ්‍ය අධ්‍යයන විෂය පදනම් වී ඇත්තේ සන්නිවේදන පර්යේෂණ පදනම් කර ගනිමිනි. සන්නිවේදන පර්යේෂණ නිරීක්ෂණ ක්‍රමවේද, සම්මුඛ සාකච්ඡා ක්‍රමවේද, උපකල්පන, උපන්‍යාස මත පදනම් වී ඇත. මෙම සියළු සංකල්ප තර්කානුකූලභාවයෙන් යුතුවේ. එමනිසා සන්නිවේදන අධ්‍යයන විෂය හදාරණ විද්‍යාර්ථයාට තර්කානුකූල භාවය මත පදනම් වූ විද්‍යාත්මක පර්යේෂණ

පරිශීලනය කිරීමට හැකිවේ. මෙතුළින් ඔහුගේ ගවේෂණශීලීත්වය සහ විචාරශීලි චින්තනය මුවහත් වේ.

5. <u>මාධ්‍ය සාක්ෂරතාව</u>

යුරෝපා කොමිසම මාධ්‍ය සාක්ෂරතාවය විග්‍රහ කරනු ලබන්නේ " මාධ්‍ය සාක්ෂරතාවය යනු මාධ්‍යයෙන් සෑම ආකාරයකින්ම ඉදිරිපත් කරන සන්දේශ පරිහරණය කිරීමට විශ්ලේෂණය කිරීමට ඇගයුම් කිරීමට හා නිර්මාණය කිරීමට ලබා ගන්නා හැකියාවයි".

මෙයින් ගම්‍යවන්නේ මාධ්‍ය මගින් කවර ආකාරයකින් හෝ ලැබෙන සන්දේශ මනාව විශ්ලේෂණය කොට එහි අරුත සැකවින් අවබෝධ කරගෙන ග්‍රහණය කර ගැනීමේ හැකියාවයි. මෙයට අමතරව යම් සන්දේශයක් අවශ්‍යතාවයට අනුකූලව නිර්මාණය කිරීමේ හැකියාව ද මෙයට අයත් වූ අංගයකි.

ඉහත සඳහන් කර ඇති ආකාරයට මාධ්‍ය මගින් සමාජගත කරන සන්දේශ වල යථාර්ථය මනාව අවබෝධ කර ගැනීම සඳහා අවබෝධයක් තිබිය යුතුය. එකී අවබෝධය සන්නිවේදන අධ්‍යයනය විෂය ප්‍රගුණ කිරීමෙන් ලබා ගත හැකිවේ.

6. <u>යහපත් ආචාරශීලී හා ඵලදායී මානව අන්තර් සම්බන්ධතා.</u>

සන්නිවේදන අධ්‍යයනය සාම්ප්‍රදායික සන්නිවේදනයේ සිට නව මාධ්‍ය උපයෝගී කරගෙන සිදු කරන නවීන සන්නිවේදනය දක්වා පුළුල් දිශානතියක් දක්වා විහිදේ. සන්නිවේදන අධ්‍යයන වලදී අන්තර් පුද්ගල සම්බන්ධතා, කණ්ඩායම් සන්නිවේදන සබඳතායන් පිළිබඳව විශ්ලේෂණය කෙරේ. එමෙන්ම එම සබඳතාවයන් වර්ධනය කර ගන්නා ආකාරය පිළිබඳව ද මෙමගින් විශේෂණය කෙරේ. එහෙයින් සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රය හැදෑරීම මගින් යහපත් මානව හිතවාදී ගුණාංගයන්ගෙන් හෙබි සන්නිවේදකයකු බවට පත්විය හැකිය.

7. <u>සමාජ ප්‍රගමණය සඳහා සක්‍රීය දායකත්වය.</u>

සමාජය විවිධ සමාජ සංස්ථාවලින් සමන්විත වේ. පවුල් සංස්ථාව, ආගමික සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව, දේශපාලන සංස්ථාව ආදී සංස්ථා වලින් සමන්විත වේ. මේ එක් එක් සංස්ථාවට පැවරුණු කාර්ය භාර්යක් පවතින අතර වෙන්වෙන් වූ පුද්ගල කණ්ඩායම් ද සමාජ සංස්ථා තුළ ඔවුන්ට අයත් කාර්යභාර්යන් ඉටු කරමින් සිටියි. සන්නිවේදන අධ්‍යයන විෂය මැනවින් හැදෑරූ පුද්ගලයන් තුළ මානව සම්බන්ධතා වර්ධනය කර ගැනීමේ ගුණය, අනෙන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ ගුණය මෙන්ම සන්දේශ අර්ථකථනය කර ගැනීම හා සන්දේශ අභ්‍යන්තරීකරණය කර ගැනීමේ ශක්‍යතාවය වර්ධනය වී ඇත.

සමාජ අවශ්‍යතා සඳහා යම් යම් කාර්යයන් සිදු කිරීමේ දී සමාජ සංස්ථා වල සිටින විවිධ කණ්ඩායම් ඒකාබද්ද කොට සමාජීය අරමුණු සාධනය කර ගැනීම සඳහා ඔවුන් පෙළ ගැස්වීමට සන්නිවේදන අධ්‍යයන විෂය ක්ෂේත්‍රය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

## 8. <u>නිර්මාණාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය.</u>

සන්නිවේදනයාගේ නිර්මාණාත්මක ගුණය ග්‍රාහකයාට සන්දේශ අභ්‍යන්තරීකරණය කර ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීමට උපකාරීවේ. අවර ගණයේ සන්දේශයක් වුවද නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමෙන් එය ග්‍රාහකයා පහසුවෙන් ග්‍රහණය කර ගනියි. බොහෝ විට අතීත සමාජවල පුද්ගලයෝ සන්නිවේදනය සඳහා නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම යොදා ගත්හ. උදා කවි, නැටුම්, ආදිය දැක්විය හැකිය. එමෙන්ම විවිධ වෘත්තීන් වලට අදාළව නිර්මාණය වූ නිර්මාණාත්මක සන්නිවේදන විධි පවතී. සන්නිවේදන අධ්‍යයනය මගින් මෙකී නිර්මාණාත්මක සන්දේශ පිළිබඳව අන්තර්ගත විශ්ලේෂණයක් සිදු කර ඒවායේ ඇති උපමා, රූපක, හැඩතල ආදිය හඳුනාගැනීමට හැකිවේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 9. <u>සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු.</u>

සන්නිවේදන අධ්‍යයන විෂයේ දී විශේෂයෙන්ම අතීතයේ සන්නිවේදන පර්යේෂණ වල නිරත වූ විවිධ ක්ෂේත්‍ර වලට අයත් විද්‍යාඥයින්ගේ වරතාපදානයන් හමුවේ. එමෙන්ම ඔවුන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කළ ආකාරය, යොදාගත් ක්‍රමවේද පිළිබඳව විද්‍යාර්ථයාට අවබෝධය ලබා ගැනීමට හැකිවේ. එමෙන්ම සන්නිවේදන ගුණාංග පිළිබඳව ද අවබෝධයක් සන්නිවේදන පර්යේෂණ විෂය පථය විශ්ලේෂණය මගින් ලබා ගත හැකිය. මෙම ලක්ෂණ උන්නතිකාමී අරමුණු වලින් හෙබි පුද්ගලයකු බවට පත්කිරීමට අවශ්‍ය මානුෂීය ගුණාංග වර්ධනය කරයි.

## 10. <u>ජනමාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයක් පුද්ගලයකු තුළ ගොඩනැන්වේ.</u>

මුද්‍රිත මාධ්‍ය විද්‍යුත් මාධ්‍ය යන ආදී ජනමාධ්‍ය වල ආයතනික ව්‍යුහය ඉතාමත්ම සංකීර්ණ වේ. එමෙන්ම ජනමාධ්‍ය ආයතන වල පොදු අපේක්ෂාව සමාජයට තොරතුරු සම්පාදනය කිරීම වුවත් දේශපාලන දෘෂ්ටීන්ට අනුව, හිමකාරිත්වයේ භූමිකාව අනුව, වාණිජ පරමාර්ථ පෙරදැරිව ඒවායේ භූමිකාව ක්‍රියාකාරිත්වයෙන් එකිනෙකට වෙනස් වේ. එමෙන්ම එක් මාධ්‍ය ආයතනයක වෘත්තිකයන් රැසක් සහ එම වෘත්තීන් හා බැඳුණු සංකීර්ණ කාර්යයන් රැසක් ක්‍රියාත්මක වේ. මෙම

සංකීර්ණ ක්‍රියාවලිය අවබෝධ කර ගැනීමට සන්නිවේදන අධ්‍යයන විෂය ප්‍රගුණ කර කිරීම වැදගත්වේ.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

## 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වාදීම.

සන්නිවේදන අධ්‍යයන විෂය යුරෝපය කේන්ද්‍ර කොටගෙන වර්ධනය වුවත් පසු කාලීනව එය ආසියාව පුරා ව්‍යාප්ත විය. නමුත් මෙහිදී අවධානය යොමු කළ යුත්තේ ආසියානු රටවල සන්නිවේදන අධ්‍යයනය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳව විශ්ලේෂණ කිරීමටයි. ආසියාවේ සන්නිවේදන විෂය ව්‍යාප්තවීම ඇමරිකාණු ආකෘතියට අනුව සිදුවිය. මුලින්ම පිලිපීනයේ පිලිපීන රාජ්‍ය විශ්වවිද්‍යාලයේ බිහිවූ ජනසන්නිවේදන අධ්‍යයන ආයතනය වැදගත්වේ.

ශ්‍රී ලංකාවේ පුවත්පත සහ ගුවන් විදුලිය බිහිවූ මුල්ම යුග වලදී ජනමාධ්‍යවේදය පිළිබඳව විද්‍යාත්මක දැනුම ලබා දීමට කිසිදු අධ්‍යාපන ආයතනයක් හෝ පුහුණු පාඨමාලාවක් නොතිබුණි. එමෙන්ම එකළ මෙම ආයතන වල සේවය කරනු ලැබුවේ කාලයක් ලේඛන කලාවේ නියලුනු හා නොයෙකුත් සමාජ ව්‍යාපාර වලට සම්බන්ධ වූ පිරිසකි. මෙම ක්ෂේත්‍ර වලට පැමිණි නවකයෝ ප්‍රවීණයන්ගෙන් අවශ්‍ය පුහුණුව හා උපදෙස් ලබා ගත්තා විනා ජනමාධ්‍යවේදය හැදෑරීම සඳහා ඔවුන්ට අවස්ථාවක් නොලබුණි. ක්ෂේත්‍රයට පැමිණි නවකයෝ අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව මාධ්‍ය පරිශීලනය කිරීමෙන් ලබා ගත්තේය. මෙය ශ්‍රී ලංකාව තුළ ක්‍රමයෙන් වර්ධනයවීගෙන එන ජනමාධ්‍ය විෂයෙහි හිස් අවකාශයක් ඉතිරි කළේය.

එකළ අනෙකුත් රටවල ජනමාධ්‍යවේදය න්‍යායික හා ප්‍රයෝගික වශයෙන් වර්ධනීය තත්ත්වයක පැවැතීම සහ විවිධ පුහුණු පාඨමාලා විශ්වවිද්‍යාල තුළ ඉගැන්වීම පිළිබඳව අවබෝධයක් එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතාට තිබුණු අතර, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය වෘත්තීකයන්ට ද මෙවැනි පාඨමාලා හඳුන්වාදීමේ වැදගත්කම ඔහුට හැඟී ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු විසින් මෙරට ජනමාධ්‍ය වෘත්තිකයෝ සඳහා විද්‍යාත්මක ජනමාධ්‍ය පුහුණු පාඨමාලා සකස් කිරීම පිළිබඳව අදාළ පාර්ශව වලට යෝජනා ඉදිරිපත් කලද කල්ගත වෙන තෙක් එය යථාර්ථයක් නොවුණි.

ශ්‍රී ලංකාව තුළ ජන සන්නිවේදන විෂය ශාස්ත්‍රීය පාඨමාවක් ලෙස ආරම්භ කිරීමට ප්‍රථම වරට සිදුවන්නේ ක්‍රි.ව.1968 දී දෙහිවල කණිෂ්ට විශ්වවිද්‍යාලය මූලික වීමෙනි. මෙම විශ්වවිද්‍යාලයේ එඩ්වින් ආරියදාස මහතාගේ මූලිකත්වයෙන් පුවත්පත් කලාවේදය නම් වූ පාඨමාලාවක් ඇරඹුණි. ඒ සඳහා එකල අධ්‍යාපන අමාත්‍යධූරය දැරූ ආර්.ආර්.ඒ.ඊ.ඊරියගොල්ල මහතා මූලිකත්වය ගෙන ක්‍රියා කොට තිබේ. කෙසේ වෙතත් මෙම පාඨමාලාව වසර දෙකක් වැනි කෙටි කාලයක දී අවලංගු වී ඇත.

ඉහත පාඨමාලාව අභාවයට පත්වීමත් සමගම නැවැතත් ජනසන්නිවේදන අධ්‍යයනය විෂය පිළිබඳව කථිකාවක් කළක් ගතවන තුරුම සමාජය තුළ ඇති නොවුණි. මේ අතර දී එනම් ක්‍රි.ව.1971 දී තරුණ කැරැල්ලක් ඇතිවිය. මෙම තරුණ කැරැල්ලෙන් පසුව කැරැල්ල ඇතිවීමට ඉවහල් වූ හේතු සහ නැවැත එවැනි කැරැල්ලක් ඇති නොවීම සඳහා ගත යුතු පිළියම් පිළිබඳව සොයා බැලීමට ඔස්මන් ජයරත්න කමිටුව පත් කරයි. මෙම කමිටුවේ නිර්දේශ සහ එවකට සිටි පාලකයන්ගේ අවශ්‍යතාවයට අනුව තරුණයන්ගේ අසහනය, විරැකියාව තුරන් කිරීම සඳහා විවිධ වෘත්තීය පුහුණු වැඩසටහන් හඳුන්වා දීමට තීරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වෘත්තීය අභිමුඛ පාඨමාලා හඳුන්වා දීමට රජය තීරණය කළේය.

ක්‍රි.ව. 1973 දී කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය බිහිවිය. මෙම අධ්‍යයන අංශය බිහිකිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද මහාචාර්ය විමල් දිසානායක, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, මහාචාර්ය එම්.බී. ආරියපාල, මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර, ආචාර්ය එඩ්වින් ආරියදාස හා ඩී.සී.රණතුංග යන විද්වත්හු පෙරමුණ ගත්හ.

මෙහිදී ගම්‍යවන වැදගත් කරුණක් නම් ජනසන්නිවේදනය විෂය ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමේ මුඛ්‍ය අවශ්‍යතාවය වූයේ තරුණයන්ගේ විරැකියාව සඳහා විසඳුම් ලබා දීමයි. මේ හේතුවෙන් මෙම විෂය ක්ෂේත්‍රය බිහිවූ  බටහිර රටවල විද්‍යාත්මක පර්යේෂණ වල ගැඹුර ශ්‍රී ලාංකේය සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අන්තර්ගත නොවුණි. මෙය මෙම විෂය හඳුන්වාදීමේ දී සිදුවූ ඌනතාවයක් ලෙස දැක්විය හැකිය. මුල් කාලයේ දී මෙම විෂය ව්‍යවහාර භාෂාවේ කොටසක් වශයෙන් විදවත්හු හැදින්වීය.

කැලණිය විශ්වවිද්‍යාලය මූලික කොටගෙන ජනසන්නිවේදන  අංශය බිහිවීමත් සමගම එහි මුල් කාලීන කථිකාචාර්යවරු වශයෙන් මහාචාර්ය විමල් දිසානායක, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, මහාචාර්ය එච්.බී. ආර්යපාල, මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර, ආචාර්ය එඩ්වින් ආරියදාස සී.සී. රණතුංග යන විද්‍වත්හු සේවය කළහ.

කැලණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය ඉගැන් වූ බාහිර කථිචාර්යවරු වශයෙන් ආචාර්ය පියසෝම මෙදිස් ඩී.බී.නිහාල්සිංහ කේ.ජයතිලක විශාරද ඩබ්ලිව්.ඩී.අමරදේව යන අය ප්‍රමුඛ විය.

කැලණිය විශ්වවිද්‍යාලයේ මෙම විෂය ඉගැන්වීම් කටයුතු ආරම්භ වීමත් සමගම අනෙකුත් විශ්වවිද්‍යාල තුළද මෙම විෂය පිළිබඳව අවශ්‍යතාවයක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1972 දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුවත්පත් කලාව යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලද අතර එය වසරක කාලයකට පමණක් සීමා විය.

ක්‍රි.ව. 1960 වර්ෂයේ දී එවකට ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවය, ලේක්හවුස් ප්‍රවෘත්තිපත්‍ර ආයතනය මගින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නියලෙන වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලා හඳුන්වා දී තිබේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

වර්තමානය වන විට ජනසන්නිවේදන විෂය පිළිබඳ පාඨමාලා කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය, රජරට විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය සහ යාපනය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලැබේ.

විශ්වවිද්‍යාල පමණක් නොව ඇතැම් පෞද්ගලික අධ්‍යාපන ආයතන මගින් ද මෙම විෂය ප්‍රයෝගික සහ න්‍යායික අන්තර්ගතයන් සහිතව උගන්වනු ලැබේ.

වර්තමානයේ දී මෙම විෂය ක්ෂේත්‍රය ආශ්‍රිතව විවිධ පර්යේෂණ සිදු කරමින් විශ්වවිද්‍යාල තුළ විධිමත් පාඨමාලා හඳුන්වාදීම සඳහා පුරෝගාමී වන විද්වතුන් වශයෙන් මහාචාර්ය තිස්ස කාරියවසම්, ආචාර්ය නන්දන කරුණාරත්න, මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, මහාචාර්ය විමල් දිසානායක වැදගත්වේ.

එයට අමතරව සන්නිවේදන පර්යේෂණ ක්ෂේත්‍රය පෝෂණය කිරීම සඳහා විවිධ පර්යේෂණවල විද්වතුන් වශයෙන් මහාචාර්ය ආරියරත්න ඇතුගල, ආචාර්ය ටියුඩර් වීරසිංහ, මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස, මහාචාර්ය මාපා තිලකරත්න මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝජ පුෂ්පකුමාර ජිනදාස වැනි විද්වත්හු ප්‍රමුඛ වෙති.

ක්‍රි.ව.1982 දී එළදැක්වුණු යුනෙස්කෝ සංවිධානයේ ගෘන්වල්ට් නිර්දේශකයන්ට අනුගත වෙමින් වර්තමානය වන විට මෙය විෂය පාසල් අධ්‍යාපනයට ද ඇතුලත් කොට තිබේ.

සන්නිවේදන විෂය විරැකියාව තුරන්කිරීමේ අභිලාෂයෙන් ආරම්භවුවත් වර්තමානය වන විට එය විශ්වවිද්‍යාල මට්මමේ පර්යේෂණ විෂයක් බවට පත්වී තිබේ. නමුත් මෙම විෂය ක්ෂේත්‍රය තුළ සිදුවන සන්නිවේදන පර්යේෂණ පිළිබඳව තොරතුරු සමාජයේ එක් පාර්ශවයක් වෙතට පමණක් සමීප වී තිබේ. එමෙන්ම වර්තමානයේ ශ්‍රීලංකාවේ ජනමාධ්‍යවල සීඝ්‍රවර්ධනයත් සමගම ඒවා මගින් සමාජ ගත කරන මතවාද දෘෂ්ටි පිළිබඳව යථාර්ථය අවබෝධ කර ගැනීම සඳහා මෙම විෂය ක්ෂේත්‍රය සාමාන්‍ය ජනතාව වෙත රැගෙන යාමට අවශ්‍ය වැඩපිළිවලක් ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 1.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ශාස්ත්‍රිය විෂයයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාව.

සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය වර්තමානයේ දී ජනප්‍රිය වෙමින් පවතින විෂය ක්ෂේත්‍රයකි. අද්‍යතනය වන විට විවිධ ආකාරයේ ජනමාධ්‍ය රාශියක් ක්‍රියාත්මක වේ. මෙම මාධ්‍ය මගින් විවිධ ආකාරයේ සන්දේශ සමාජගත කරයි. ඇතැම් සන්දේශ සමාජයට හිතකර බලපෑම් එල්ල කරන අතර ඇතැම් සන්දේශ සමාජයට අයහපත් ප්‍රතිඵල ඇති කරයි. ජනමාධ්‍ය මගින් සමාජගත කරන සන්දේශ පිළිබඳව මනාව අවබෝධ කර ගැනීම සඳහා මෙම විෂය ක්ෂේත්‍රය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

1982 වර්ෂයේ දී යුනෙස්කෝ සංවිධානයේ ගෲන්වල්ට් ප්‍රකාශනයෙන් කළ නිර්දේශයන් පදනම් කොටගෙන 2006 වසරේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය පාසල් විෂය ධාරාවට හඳුන්වා දුනි. මෙහිදී 10 සහ 11 ශ්‍රේණි සඳහා අතිරේක විෂයක් ලෙසත්, 2008 වසරේ සිට උසස් පෙළ කලා විෂය ධාරාවට ප්‍රධාන විෂයක් ලෙසත් හඳුන්වා දෙන ලදී.

මෙහිදී මාධ්‍ය අධ්‍යාපනය යනු කුමක්ද යන්න පිළිබඳව විමසීම වැදගත්වේ. සරලවම මාධ්‍ය අධ්‍යාපනය යනු කුමක්ද යන්නෙන් විස්තර කලහොත් මාධ්‍ය අධ්‍යාපනයෙන් සිදු කරන්නේ පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවයෙන් යුතු අයෙකු බවට පත්කිරීමයි. එනම් මාධ්‍ය මගින් ලබා දෙන සන්දේශ දෙස විචාරශීලීව බැලීමේ හැකියාව වර්ධනය කිරීමයි.

මාධ්‍ය අධ්‍යාපනය (අධ්‍යයනය) ලබා දීමේ දී සියලුම මාධ්‍ය පිළිබඳව අවබෝධයක් ඇති කිරීම වැදගත්වේ. මෙහිදී චලන රූප ඇතුලත් චිත්‍රපටි, රූපවාහිනිය, ගුවන්විදුලිය, වීඩියෝපට මෙන්ම සියලුම මුද්‍රිත මාධ්‍ය පිළිබඳව මෙන්ම අංකිත මාධ්‍ය පිළිබඳව ද අවබෝධය ලබා දේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

මෙහිදී යුනෙස්කෝ සංවිධානය විසින් පාසලේ ප්‍රාථමික ශ්‍රේණියේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා සිදු කරන ලද නිර්දේශය දැක්වීම වැදගත්වේ.

" එයින් සමාජයට මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය විචාරශීලීව පරිහරනය කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප පෝෂණය කල හැකි බවත්, එය ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය නිපුණතාවයක් වන බවත්, මාධ්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා සකස් කරනු ලබන වැඩසටහන්වල මාධ්‍ය නිෂ්පාදනයන් සම්බන්ධ විවරණයන්, නිර්මාණශීලී ආවේදනයන් පල කිරීමේ මාධ්‍යයක් ලෙස ජනමාධ්‍ය භාවිත කල හැකි ආකාරයත්, ඵලදායී ලෙස මාධ්‍ය පරිහරණය කිරීම හා සක්‍රිය අයුරින් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගීවීම යන කරුණු පිළිබඳව අන්තර්ගත කළ යුතු බවයි."

**මෙහිදී යුනෙස්කෝ සංවිධානය පාසල් විෂය ධාරාවට මාධ්‍ය අධ්‍යාපනය ඇතුලත් කිරීමට නිර්දේශ කරන ලද්දේ කවර හේතුවක් නිසාද යන්න පිළිබඳව විමසීම වැදගත්වේ. 1980 දශකය වන විට ජනමාධ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය බාල සහ තරුණ පරපුරට අහිතකර ලෙස බලපාන ලදී. එහෙයින් මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳව ඔවුන්ට මනා අවබෝධයක් ලබා දීම සඳහා මෙම විෂය පාසල් විෂය ධාරාවට ඇතුලත් කර ඇත.**

**යුනෙස්කෝ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමෙන් පසුව ජනමාධ්‍ය පරිශීලනය පිළිබඳව නව ලෝක මතයක් ඇතිවිය. එය මතය නම් "ජනමාධ්‍ය වලින් සිදුවන අහිතකර බලපෑම නිසා පුද්ගලයා ජනමාධ්‍ය වලින් ඈත් නොකර ඔහු තුළ ජනමාධ්‍ය පරිශීලනය කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම වැදගත් බවයි."**

<u>මාධ්‍ය අධ්‍යාපනය මනාව හැදෑරීම මගින් පුද්ගලයන් තුළ කුසලතා දෙකක් වර්ධනය වේ.</u>

1. **මාධ්‍ය සාක්ෂරතාවය වර්ධනයවීම.**
2. **විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය ශික්ෂණය වර්ධනය වීම.**

**මෙහිදී උසස් පෙල විෂය නිර්දේශයට නියමිත සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂය කොටස් දෙකක් යටතේ විග්‍රහ කළ හැකිය.**

සන්නිවේදනය.

මාධ්‍ය අධ්‍යයනය

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

**මෙහි සන්නිවේදනය යටතේ සන්නිවේදනය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචන, සන්නිවේදනයේ පදනම, සන්නිවේදනයේ කාර්යභාර්ය, විවිධ සන්නිවේදන වර්ග, සන්නිවේදන ආකෘති පිළිබඳව හදාරයි.**

**මාධ්‍ය අධ්‍යාපනය යටතේ දී හැදෑරීමට අපේක්ෂා කරන්නේ මාධ්‍ය පිළිබඳව ඉගෙනීම, මාධ්‍යයේ ස්වභාවය, එහි අන්තර්ගතය, විකාශය, පරිනාමය, ක්‍රියාකාරීත්වය මෙන්ම එය පුද්ගලයාට සහ සමාජයට බලපාන ආකාරය පිළිබඳව හැදෑරීමයි.**

**යහපත් මානව සම්බන්ධතාවයන් පැවැත්වීම සඳහාත් ඒවා වර්ධනය කර ගැනීම සඳහාත් සන්නිවේදන කුසලතාවය වැදගත් වේ.**

**යම් අයෙක් මාධ්‍ය අධ්‍යාපනය නිසි පරිදි හැදෑරුවහොත් ඔහුගේ මාධ්‍ය සාක්ෂරතාවය වර්ධනය වේ. එමෙන්ම විචාරශීලීව මාධ්‍ය පරිශීලනය කිරීමට අවැසි අවබෝධය ද වර්ධනය වේ.**

ප්‍රාග්ඓතිහාසික යුගවලදී මානවයා භාවිතා කරන ලද ප්‍රාථමික සන්නිවේදන ක්‍රම වලින් මෙන්ම වර්තමානයේ දී භාවිතා කරන අංකිත සන්නිවේදන මෙවලම් වලින් ද පුද්ගලයාට සහ සමාජයට බලපෑම් සිදුවේ. මෙම බලපෑම් පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා මෙම විෂය ප්‍රගුණ කිරීම වැදගත්වේ.

යම් පුද්ගලයෙක් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය විධිමත්ව (මනාව) හැදෑරීමෙන් ඔහුට පහත සඳහන් කුසලතා වර්ධනය කර ගත හැකිය.

I. සන්නිවේදන කුසලතා වර්ධනය.
II. මාධ්‍ය සාක්ෂරතාවය.
III. විචාරශීලි මාධ්‍ය පරිහරණය.
IV. අවස්ථානුකූල භාෂා භාවිතය.
V. මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය.
VI. මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම.
VII. තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය.
VIII. මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳව අවබෝධය.
IX. යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායකවීම.
X. නිර්මාණශීලි සන්නිවේදන කුසලතා.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

සන්නිවේදන කුසලතා වර්ධනය.

විද්‍යාර්ථයෙක් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය ක්ෂේත්‍රය විධිමත්ව හැදෑරීම තුළින් ඔහුගේ පුද්ගලාන්තර සන්න්වේදන ශක්‍යතාවය, කණ්ඩායම් සන්නිවේදන ශක්‍යතාවය, මෙන්ම ඔහුගේ ප්‍රතිපෝෂණ ගුණය ද පුළුල් වේ. මෙමගින් පවුල් සංස්ථාව, ආගමික සංස්ථාව, වෘත්තීය කණ්ඩායම්, උප සංස්කෘතීන් සමග යහපත්ව සන්නිවේදනය කිරීමේ හැකියාව වර්ධනය වේ. එමෙන්ම වෙනත් සන්නිවේදකයන්ට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීමේ ගුණය ඔහු තුළ වර්ධනය වේ. මෙතුළින් සහජීවනයෙන් යුතුව කටයුතු කිරීමේ හැකියාව ලැබේ. මෙය සන්නිවේදන අධ්‍යයනය විෂය හැදෑරීම මගින් ලබාගත හැකි කුසලතාවයකි.

මාධ්‍ය සාක්ෂරතාවය.

මාධ්‍ය සාක්ෂරතාවය යනු මාධ්‍ය මගින් ලබා දෙන විවිධ ආකාරයේ සන්දේශවල අන්තර්ගතය පැහැදිළිව විවරණය කර ගැනීමේ හැකියාවයි. මෙමගින් මාධ්‍ය මගින් සිදු කරන අනවශ්‍ය පෙලඹවීම් වලින් වැලැකීමටත්, අනවශ්‍ය සන්දේශ බැහැර කිරීමටත්, තමන්ට සුදුසු සන්දේශ පමණක් අභ්‍යන්තරීකරණය කර ගැනීමටත් හැකිවේ.

විචාරශීලි මාධ්‍ය පරිහරණය.

ජනමාධ්‍ය විවිධ අභිමථාර්ථ කෙන්ද්‍ර කොට ගනිමින් සිය භූමිකාව රග දක්වයි. රාජ්‍ය මාධ්‍යවල පරමාර්ථ වලට වඩා වෙනස් පරමාර්ථ පෞද්ගලික මාධ්‍ය වල පවතින අතර එයට හාත්පසින්ම වෙනස් පරමාර්ථ ජාත්‍යන්තර ජනමාධ්‍ය වල පවතී. විවිධ මාධ්‍ය වල පරමාර්ථ අවබෝධ කර ගැනීම සඳහා සන්නිවේදන අධ්‍ය

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

අවස්ථානුකූල භාෂා භාවිතය.

ලේඛනයේදීත්, භාෂණයේදීත් අවස්ථානුකූල භාෂා භාවිතය ඉතාමත්ම වැදගත්වේ. එතුළින් ඉලක්කගත කණ්ඩායම පහසුවෙන් ආකර්ශණය කරගත හැකිය. මෙම ශක්‍යතාවය සඳහා සන්නිවේදන අධ්‍යයනය පිළිබඳ අවබෝධය වැදගත්වේ.

මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය.

සමාජයක ජන සංස්කෘතිය සහ මාධ්‍ය මගින් ගොඩනගන සංස්කෘතිය යනුවෙන් සංස්කෘතියේ අංශ දෙකක් පවතී. සමාජයක ජනසංස්කෘතිකාංග පාරම්පරිකව ගලාගෙන යයි. එකී සමාජයේ සමාජිකයන් සංස්කෘතිකාංග වලට අනුකූලව ස්වකීය ප්‍රතිරූපය, ඇවැතුම් පැවැතුම් හා චර්යාවන් හැඩගස්වා ගනියි. එම සංස්කෘතිකාංග නොපිලිගැනීම හෝ ඛන්ඩනය කිරීම පුද්ගලයා එකී සමාජයෙන් ප්‍රතික්ෂේපවීමට ඉවහල්වේ.

නමුත් මාධ්‍ය මගින් මවන සංස්කෘතිය වාණිජ පරමාර්ථ, මාධ්‍ය හිමිකාරිත්වයේ මතවාද කේන්ද්‍ර කොටගත් වාණිජ වෙළඳපොල ඉලක්කකරගත් සංස්කෘතිකාංග ගොඩනගියි. එපමණක් නොව පුද්ගලයන්ගේ භාවයන් උද්දීපනය කොට පුද්ගල චර්යාවන් වෙනස් කරයි. එමෙන්ම මතවාද සමාජයට එන්නත් කරයි. මාධ්‍ය සංස්කෘතිකාංග බොහෝ විට ජනසංස්කෘතියට බලපෑම් කරයි. සමාජ හරපද්ධතියට හානි කරයි. මේ පිළිබඳව විද්‍යාත්මක අවබෝධය මෙම විෂය මගින් ලබාගත හැකිය.

මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම.

ජනමාධ්‍ය ස්වකීය මතවාද හා දෘෂ්ටීන් පුද්ගලයාට එන්නත් කොට පුද්ගල හැසිරීම් වෙනස්කිරීමට යත්න දරයි. එමෙන්ම සමාජයේ විවිධ මතවාද රෝපණය කිරීමට ද ජනමාධ්‍ය වලට සුවිශේෂී හැකියාවක් පවතී. මෙමගින් සමාජය විෂයෙහි සිදු කරන බලපෑම සුළු පටු නොවේ. පුද්ගල

**සහජීවනය බිඳදැමීමටත්, අපගාමී චර්යායවන් රෝපණය කිරීමටත් ජනමාධ්‍ය ඉවහල් වේ. මෙම ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය මෙම විෂය මගින් ලබා දේ.**

**<u>තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය.</u>**

**මීට දශක කිහිපයකට පෙර එනම් ශ්‍රී ලංකාවට මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හදුන්වාදුන් මුල් යුගයේ දී මෙරට ජනතාව තුළ පුළුල් විශ්වසනීයත්වයක් මාධ්‍ය මගින් ලබා දෙන සන්දේශ කෙරෙහි පැවැතුණි. වර්තමානයේ දී ද මෙම තත්ත්වය දැකගත හැකිය. ඇතැම් පුද්ගලයෝ අදටත් " පත්තරේ තිබුණා." "ටී.වී.එකේ පෙන්නුවා" " රේඩියෝ එකේ කියුවා" යනුවෙන් ජනමාධ්‍ය මගින් ලබාදෙන සන්දේශ කෙරෙහි දැඩි විශ්වසනීයත්වයක් තබති. නමුත් ජනමාධ්‍ය පිළිබඳව යථා අවබෝධයක් ඔවුන් තුළ පවතින්නේ නම් ඔවුන්ගේ මෙම අන්ධ විශ්වාසය තුරන්වේ. එහෙයින් මෙම විෂය හැදෑරීම මගින් පුද්ගලයාගේ මාධ්‍ය පරිහරණය කිරීමේ අවබෝධය වර්ධනයවේ.**

**<u>මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳව අවබෝධය.</u>**

**මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතන වලට සිය කාර්යභාර්ය මැනවින් සිදු කරගෙන යෑම සඳහාත්, වගකීමෙන් යුතුව තොරතුරු සමාජගත කිරීම සඳහාත් රජය මගින් හා වෙතන් ස්වෙච්ඡා සංවිධාන විසින් විවිධ අණපනත් සහ ආචාර ධර්ම හඳුන්වා දී තිබේ. මේ පිළිබඳව පුළුල් අවබෝධයක් මෙම විෂය හැදෑරීම මගින් ලබාගත හැකිය.**

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

**<u>යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායකවීම.</u>**

**සමාජයක් සංවර්ධන අභිමථාර්ථ සාධනය කර ගැනීම සඳහා කටයුතු කිරීමේ දී සියළු දෙනාම එක් නිශ්චිත ඉලක්කයක් දෙසට පෙළ ගැස්සිය යුතුය. එක් නිශ්චිත ඉලක්කයක් දෙසට සමාජය පෙළ ගැස්වීමට නම් ධනාත්මක සන්නිවේදනයක් අවශ්‍ය වේ. මෙන්ම සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරිමේදීත්, ඒ සඳහා දැනුවත් කිරීමේදීත් මෙම විෂය පථය පිළිබඳ අවබෝධය වැදගත්වේ.**

<u>නිර්මාණශීලි සන්නිවේදන කුසලතා.</u>

සන්නිවේදකයාගේ නිර්මාණාත්මක ගුණය ග්‍රාහකයාගේ ආකර්ශනය සඳහා ඉවහල් වේ. නිර්මාණශීලීව යම් සන්දේශයක් ඉදිරිපත් කිරිමෙන් එකී සන්දේශය කරා ග්‍රාහක ආකර්ශනය පහසුවෙන් ලබා ගත හැකිය. පුද්ගල චර්යාව වෙනස් කිරීම සඳහා සන්දේශ සකස් කිරීමේදීත්, දැනුවත් කිරීමේ සන්දේශ ඉලක්ක ගත ප්‍රජාවකට ලබා දීමේදීත්, නිර්මාණශීලී ගුණය වැදගත්වේ. සන්නිවේදන අධ්‍යයනයෙහි නිර්මා… හැකිය.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

## <u>2.1 සන්නිවේදනය හඳුනා ගැනීම.</u>

සන්නිවේදනය යන්න මානවයාට පමණක් පොදුවූවක් නොවේ. එය සමස්ත විශ්වයටම ආවේනික වූ ධර්මතාවයකි. මේ පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී ගම්‍යවන්නේ මේ සඳහා නිර්වචන දහසකට ආසන්න සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති බවයි.

විවිධ භාෂා වලින් සන්නිවේදනය හඳුන්වා ඇති ආකාරය මිමසා බැලීම මෙහිදී වැදගත්වේ. සන්නිවේදනය යන්නට ඉංග්‍රීසියෙන් භාවිතා වන "**communication**" යන පර්යාය පදය ලතින් භාෂාවේ එන "**communicare**" යන වචනයෙන් සකස් වී ඇත. එහි තේරුම වන්නේ බෙදාහදා ගැනීම, පිරිසක් අතර හුවමාරුකර ගැනීම, අදහස් ඉදිරිපත් කිරීම, දැනුවත් කිරීම, එක්කාසුවීම යන්නයි. එමෙන්ම "**communis**" යන්නෙන් අර්ථවත්වන්නේ පොදු තත්ත්වයක් බවට පත්කිරීම යන්නයි. මෙහිදී හුවමාරු කරගන්නා සංඥා හා සංකේත පද්ධතියක් ඔස්සේ යම් අර්ථයක් ගෙන ඒමේ ක්‍රියාවලිය සන්නිවේදනය නමින් හැදින්වේ.

දෙමල බසින් මෙහි අර්ථය "තෝඩර්පාඩාල්" යනුවෙනි. මෙහි අර්ථය සබඳතා පැවැත්වීම යන්නයි.

සන්නිවේදනය යන්නට සිංහල භාෂාවේ එන අර්ථය විමසීමේ දී පැහැදිලිවන්නේ "මැනවින් දැනුම්දීම" යන්නයි.

සන්නිවේදනය යන වචනාර්ථය හැදින්වීම සඳහා විවිධ භාෂාවල භාවිතවන අර්ථ සියල්ලම කැටිකොට ගත්විට පසක්වන්නේ "අදහස් හුවමාරුව" සන්නිවේදනය බවයි.

සන්නිවේදනය යන්නට සීමාවක් සොයාගත නොහැක. විශේෂයෙන්ම සන්නිවේදන ක්‍රියාවලිය මානවයින් අතර සිදුවන විට දි එය මානව සන්නිවේදනය නමින් හඳුන්වයි. සත්ත්වයින් අතර සිදුවන සන්නිවේදන ක්‍රියාව සත්ත්ව සන්නිවේදනය නමින් හඳුන්වයි. වාචිකව සිදුවන විටදී වාචික

සන්නිවේදනය නමින් හදුන්වයි. සංඥා, සංකේත හා අභිනය මගින් සිදුවන විට එය නිර්වාචික සන්නිවේදනය නමින් හදුන්වයි. ලිඛිතව සිදුවන විට ලිඛිත සන්නිවේදනය නමින් හදුන්වයි. මානවයා විද්‍යුත් මෙවලමක් භාවිතයෙන් සිදු කරන සන්නිවේදනය යන්ත්‍රසහයක පුද්ගලාන්තර සන්නිවේදනය නමින් හදුන්වයි. පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවන සන්නිවේදනය පුද්ගලාන්තර සන්නිවේදනය නමින් ද කණ්ඩායම් අතර සිදුවන සන්නිවේදනය කණ්ඩායම් සන්නිවේදනය නමින් ද ජනමාධ්‍ය ඇසුරු කරගෙන සිදු වන සන්නිවේදනය ජන සන්නිවේදනය නමින් ද පුද්ගලයා සිතීම, පරිපකල්පනය, ආවර්ජනය සිදු කිරීම අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය නමින් ද හදුන්වයි.

සමාජයක පදනම සහ අන්තර් ක්‍රියාකාරිත්වය රදා පවතින්නේ සන්නිවේදනය මතයි. විධිමත් සන්නිවේදනයක් ඇති තැන සාමය, සමගිය, සහජීවනය, වර්ධනය වේ. සන්නිවේදනය බිඳ වැටුණු තැන ගැටුම් නිර්මාණය වේ.

ලෝකය සම්භවයේ දී මානව සන්නිවේදනය සහ සත්ත්ව සන්නිවේදනය සම මට්ටමක් පැවැතුණි. නමුත් මානවයා ක්‍රමයෙන් පරිනාමය වීමත් සමගම ඔවුන්ගේ සන්නිවේදන ක්‍රමවේදයන් ද සංකීර්ණ විය.

මානව පරිනාමයේ මුල් යුලයේ දී මානවයා ස්වකීය අංග චලන, අභිනය, ශබ්ද, චිත්‍ර මගින් සන්නිවේදනය සිදු කළේය.

ලේඛනය වර්ධනය වීමත් සමගම සන්නිවේදනයේ නිම් වළලු ද පුළුල් විය. විශේෂයෙන්ම ලේඛන කලාවේ සම්භවය මානව සන්නිවේදනයේ නව පිටුවක් පෙරළුනි. එනම් තොරතුරු සුරක්ෂිතව තබා ගැනීමට සහ සංරක්ෂණය කර ගැනීමට මංපෙතක් විවරවීමයි.

සන්නිවේදනය සඳහා විද්‍යුත් මාධ්‍ය හදුන්වා දීමත් සමගම සන්නිවේදනය සමාජය මත ඇති කරන බලපෑම වඩාත් තීව්‍රරවිය. එමෙන්ම සන්නිවේදනය වාණිජ අරමුණු කේන්ද්‍ර කොටගෙන සිදුවිය.

වර්තමානයේ දී සමාජ මාධ්‍ය බිහිවීමත් සමගම පුද්ගලයා ස්වකීය අනන්‍යතාවය සගවා ගනිමින් සන්නිවේදනයේ යෙදෙයි. සමාජ මාධ්‍ය මගින් ගොඩනගන්නේ තාවකාලික සබඳතාවයන්ය. එමෙන්ම අව්‍යාජත්වය, ලෙන්ගතුකම මානව ගුණාංග වෙනුවට ව්‍යාජ භාවාත්මක හා වාණිජ අරමුණු මත පදනම් වූ සබඳතා ගොඩ නැගී ඇත.

සන්නිවේදනය මානව පරිනාමයත් සමගම සංකීර්ණවන අතර එමගින් මානවයාට සහ සමාජයට සිදුවන බලපෑම පෙරට වඩා බලවත් වී තිබේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 2.2 සන්නිවේදනයේ ස්වභාවය.

සන්නිවේදනය පිළිබඳව විශ්ලේෂණ කිරීමේ දී ක්‍රියාකාරීත්වය අනුව එහි සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. යම් සන්දේශයක් සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙතට ගමන් කිරීම දක්වා සිදුවන ක්‍රියාවලිය සන්නිවේදනය වශයෙන් සරලව හැඳින්විය හැකිය. ස්වරූපය අනුව, අවශ්‍යතා අනුව මෙන්ම සංස්කෘතිය අනුව ද සන්නිවේදනය විවිධ ආකාරයෙන් සිදුවේ. කවර ආකාරයකින් සන්නිවේදනය සිදුවුවත් සමස්ත සන්නිවේදන ක්‍රියාවලිය තුළ හඳුනාගත හැකි පොදු ලක්ෂණ කිහිපයක් පවතී.

**01.** <u>සන්නිවේදනය අරමුණු සහිතය.</u>

සන්නිවේදන ක්‍රියාවලිය කිසියම් හෝ අරමුණක් කේන්ද්‍රකොට ගනිමින් සිදුවේ. මානව සම්භවයේ මුල් යුගයේ දී මානවයා මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සන්නිවේදනයේ යෙදුනි. උදා: ආරක්ෂාව සපයා ගැනීමට, ලිංගික කාර්යන් සඳහා. ක්‍රමයෙන් මානවයාගේ අවශ්‍යතා සංකීර්ණවීමත් සමගම ඔහුගේ අවශ්‍යතා වලට අනුරූපව සන්නිවේදනය ද සංකීර්ණ විය. වර්තමානයේ දී මානවයා විද්‍යාත්මක දැනුම හුවමාරුකර ගැනීම සඳහා අධ්‍යාපන අරමුණු සඳහා ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා නව නිෂ්පාදන පිළිබඳ දැනුම හුවමාරුකර ගැනීම සඳහා යන සංකීර්ණ අරමුණු ඉටුකර ගැනීම සඳහා සන්නිවේදනයේ යෙදෙයි.

සත්ත්ව සන්නිවේදනය, යන්ත්‍ර අතර සිදුවන සන්නිවේදනය ආදී සන්නිවේදන ක්‍රියා සිදු වන්නේ විවිධ අරමුණු කේන්ද්‍ර කොට ගනිමිනි. සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් සංකීර්ණවීමට නම් සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ අරමුණු සමාන විය යුතුය. උදා: ගුරුවරයකු විසින් විෂය සම්බන්ධ ගැටලුවක් ශිෂ්‍යකුට පැහැදිළි කිරීමේ දී ගැටලුව මනාව අවබෝධ කර ගැනීමට නම් ශිෂ්‍යා තුළද එම ගැටලුව විසදා ගැනීම සඳහා අවශ්‍යතාවයක් තිබීම වැදගත්වේ. මේ අයුරින් සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීමට නම් සන්නිවේදකයාගේ සහ ග්‍රාහකයාගේ අරමුණු සමානවීම වැදගත්වීම වැදගත්වේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

**02.** <u>සන්නිවේදනය සංකේතාත්මකය.</u>

සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර සන්නිවේදනය සිදු වීමේ දී භාෂාව, සංකේත, සංඥා, අක්ෂර අභිනයන් භාවිතා වේ. සන්නිවේදනය කුමණ ආකාරයකින් සිදුවුවත් ඒ සඳහා සංකේත, අක්ෂර, රූප භාවිත වේ. මෙහිදී වැදගත්වන්නේ සන්නිවේදකයා සංකේත ඇසුරින් ඉදිරිපත් කරන

සන්දේශය ග්‍රාහකයාට වැටහෙන ආකාරයෙන් අක්ෂර, රූප, සංකේත, සංඥා ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමයි. සන්නිවේදකයා ඉදිරිපත් කරන සන්දේශය ග්‍රාහකයාට නොවැටහෙන භාෂාවකින් ඉදිරිපත් කළහොත් සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක වේ. සන්නිවේදකයා සහ ග්‍රාහකයා යන දෙදෙනා තුළම භාවිත කරන සංකේත පිළිබඳව යහපත් අවබෝධයක් පැවැතීම තුළින් සන්නිවේදන ක්‍රියාව සාර්ථක වේ. (උදා රහස් පණිවිඩයක් සංකේත මගින් යැවීමේ දී සන්නිවේදකයාට සහ ග්‍රාහකයාට එම රහස් භාෂාව පිළිබඳව අවබෝධයක් පැවැතීම වැදගත්වේ).

### 03. සන්නිවේදනය සන්දර්භානුගතය.

සන්නිවේදනය සිදුවන පරිසරය මෙයින් අදහස්වේ. සන්නිවේදනය සිදු වන පරිසරය, අවස්ථාව මත සන්නිවේදන ක්‍රියාව වෙනස් වේ. යම් පුද්ගලයකු නිවසේ සමාජිකයන් සමග සිදු කරන සන්නිවේදනයට වඩා වෙනස් ආකාරයකින් උත්සව අවස්ථාවකට සහභාගී වී සන්නිවේදනය කරයි. එයට වඩා වෙනස් ආකාරයකින් අවමංගල්‍ය උත්සවයකට සහභාගී වී සන්නිවේදනයේ යෙදෙයි. ස්වකීය යහළුවන් සමග සන්නිවේදනය කර ගන්නා ආකාරයට වෙනස් ආකාරයකින් වෘත්තීය ස්ථානයේ දී පුද්ගලයෝ සන්නිවේදනයේ නිරත වෙති. නිදසුන් ලෙස වෘත්තීය සමිති තුළ සිදුවන සන්නිවේදන ක්‍රියා, පාසලේ පංති කාමරයේ සිදු වන සන්නිවේදන ක්‍රියා, ආගමික ස්ථානයකට ප්‍රවිශ්ට වූ පසුව සිදුවන සන්නිවේදන ක්‍රියා දැක්විය හැකිය. මේ අනුව පරිසරය, සංස්කෘතිය, තත්ත්වය සහ කාර්භාර්ය මත පුද්ගලයාගේ සන්නිවේදන ක්‍රියාවේ ස්වරූපය ද වෙනස් වේ.

### 04. සන්නිවේදනය ක්‍රියාපටිපාටියකි.

සන්නිවේදනය ක්‍රියාවලියකි. සන්නිවේදනය කිසිවිටකත් හුදකලා ක්‍රියාවලියක් නොවේ. සන්නිවේදනයේ ස්වරූපය අනුව, වර්ගය අනුව සන්නිවේදන ක්‍රියාපටිපාටියේ ස්වරූපය වෙනස් වේ. නිදසුනක් ලෙස ලිඛිත සන්නිවේදනයේ දී මුලින්ම මනසට සංකල්පනා පැමිණේ. දෙවනුව ඒවා සැලසුම් කර ගනියි. තෙවනුව එම සැලසුම් කළ අදහස් ලේඛනයට ඇතුලත් කරයි.

වාචික සන්නිවේදනයේ දී මුලින්ම සිතට සංකල්පනා පැමිණේ. ඉන්පසුව මනසින් ඒවා අනුපිළිවලට සකස් කර ගනියි. අවස්ථානුකූලව වාචිකව සහ අභිනය මගින් ග්‍රාහකයාට පවසයි. යන්ත්‍ර අතර සිදුවන සන්නිවේදනය තුළද ක්‍රියා පිටිපාටියක් දැකිය හැකිය. පරිගණකයෙන් පාලනය වන රොබෝ යන්ත්‍රයකට සංඥාවක් යැවීමේ දී මුලින්ම පරිගණකය විසින් සන්දේශය සංඥාවක් බවට පරිවර්තනය කරයි. ඉන්පසුව එම සංඥාව විද්‍යුත් තරංගයක් ලෙස රොබෝ යන්ත්‍රයට යවයි. රොබෝ යන්ත්‍රය විසින් ලැබුණ සංඥාව කේතයක් බවට පත් කර ගනියි. පසුව එම කේතයට

අනුකූලව යන්ත්‍රය ක්‍රියාත්මක වේ. මේ අනුව සියලුම සන්නිවේදන වර්ග යම් ආකාරයක පිළිවෙලක් අනුව සිදුවේ. මෙය සන්නිවේදනයේ ක්‍රියා පටිපාටිය ලෙස හැදින්විය හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 05. සන්නිවේදනය විවිධාකාර වේ.

සන්නිවේදනයේ ස්වරූපය සහ වර්ගය අනුව සන්නිවේදනය විවිධාකාර වේ. විශේෂයෙන්ම අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සිදුවන ආකාරයට වඩා වෙනස් ආකාරයෙන් පුද්ගලාන්තර සන්නිවේදනය සිදුවේ. පුද්ගලාන්තර සන්නිවේදනය සිදු වන ආකාරයට වෙනස් ආකාරයෙන් කණ්ඩාම් අතර සන්නිවේදන ක්‍රියාවලිය සිදුවේ. කණ්ඩායම් අතර සන්නිවේදනය සිදුවන ආකාරයට වඩා වෙනස් ආකාරයෙන් ජන සන්නිවේදන ක්‍රියාවලිය සිදුවේ.

සංස්කෘතියේ බලපෑම වන තාක්ෂණයේ බලපෑම හේතුවෙන් සන්නිවේදන ක්‍රියාවලිය සංකීර්ණ වී තිබේ. නිදසුනක් ලෙස ආසියානු රටක පුද්ගලයකු පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදීමේ දී භාවිතා කරන සංකේත, රූප, සංකේත වලට වඩා වෙනස් ආකාරයේ සංඥා, රූප, සංකේත පෙලක් යුරෝපියානු පුද්ගලයෙක් පුද්ගලාන්තර ස්නිවේදනයේ යෙදීමේ දී භාවිත කරයි.

## 06. සන්නිවේදනය ඒකමාර්ගික මෙන්ම ද්විමාර්ගිකවේ.

සන්නිවේදන ක්‍රියාවලිය ආකාර දෙකකට ක්‍රියාත්මක වේ. එනම් ඒකමාර්ගික හා ද්විමාර්ගික වශයෙනි. ප්‍රතිපෝෂණයක් සිදු නොවන සන්නිවේදනය ඒක මාර්ගික වන අතර ප්‍රතිපෝෂණ ක්‍රියාවක් සිදු වන සන්නිවේදනය ද්වි මාර්ගික වේ.

ඒක මාර්ගික සන්නිවේදනයට නිදසුන් වශයෙන් පොස්ටර්, අත්පත්‍රිකා, රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත මගින් පණිවිඩයක් යැවීම දැක්විය හැකිය. ද්වි මාර්ගික සන්නිවේදනයට නිදසුන් ලෙස මිතුරන් දෙදෙනෙකු එක්වී සංවාදයේ යෙදීම. පුද්ගලයන් දෙදෙනෙකු දුරකථනය ඔස්සේ සංවාදයේ යෙදීම. පුද්ගලයන් දෙදෙනෙක් අන්තර්ජාලයේ හරහා චැට් කිරීම දැක්විය හැකිය.

ඒකමාර්ගික සන්නිවේදනයට වඩා ද්විමාර්ගික සන්නිවේදනය වැදගත්වේ. විශේෂයෙන්ම සන්නිවේදන ක්‍රියාව සාර්ථක කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපෝෂණ ක්‍රියාව මැනවින් සිදු වන්නේ ද්විමාර්ගික සන්නිවේදනය මගිනි.

**07.**<u>සන්නිවේදනය බලයවේ.</u>

සමස්ත මානව සහ සත්ත්ව සන්නිවේදන ක්‍රියාකාරිත්වයට පදනම වී ඇත්තේ සන්නිවේදනයයි. සන්නිවේදන වර්ග වෙනවෙනම ගතහොත් මේවායින් පුද්ගලයාට සහ සමාජයට සුවිශේෂී බලපෑමක් සිදුවේ. වර්තමානයේ ජනසන්නිවේදන මාධ්‍ය වලට සුවිශේෂී බලයක් ඇති අතර එමගින් සමාජයට විවිධ මතවාද එන්නත් කරීම, පුද්ගල චර්යාවන් වෙනස් කොට ඔවුන් අධි පරිභෝජනයට හුරු කරවීම සිදු කරයි. එමෙන්ම සාම්ප්‍රදායික මතවාද කණ්ඩනය කොට ජනප්‍රිය සංස්කෘතිකාංග සමාජ ගත කරයි. මෙවැනි බලයක් ජනසන්නවේද මාධ්‍ය තුළ පවතී.

අන්තර් පුද්ගල සන්නිවේදනයේ ඇති බලය පිළිබඳව විශ්ලේෂණ කිරීමේ දී එම සන්නිවේදනය පවුල් සංස්ථාව තුළ යහපත් අයුරින් ක්‍රියාත්මක වුවහොත් පවුලේ සමාජිකයන් අතර ලෙන්ගතු සමීප සබඳතා ගොඩ නැගේ. නමුත් එය සෘණාත්මකව ක්‍රියාත්මක වුවහොත් එකී සාමාජිකයන් අතර පවතින සබඳතා දුර්වල වී එම තත්ත්වය ගෘහස්ත ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය විය හැකිය.

කණ්ඩායම් සන්නිවේදනය තුළද සුවිශේෂී බලයක් පවතී. යම් උප සංස්කෘතියක් තුළ පවතින අගනාකම්, ධර්මතා වර්ධනයට පත්වීම සඳහා එකී කණ්ඩායම තුළ සාමාජීයන් අතර ක්‍රියාත්මක වන කණ්ඩායම් සන්නිවේදනය වැදගත්වේ. කාණ්ඩායම් සන්නිවේදනයේ ධනාත්මක ආකාරයෙන් ක්‍රියාත්මක වුවහොත් අපේක්ෂිත ඉලක්ක පහසුවෙන් සාධනය කර ගත හැකිවේ. නමුත් යම් කණ්ඩායමක සිදුවන කණ්ඩාම් සන්නිවේදනය සෘණාත්මක වුවහොත් එකී කණ්ඩායමේ සහජීවනය බිඳවැටේ. කණ්ඩායමට ස්වකීය අභිමථාර්ථ නිවැරදිව සාධනය කර ගැනීමට නොහැකි වේ. වෘත්තීය ස්ථානවල කාර්ය මණ්ඩල බලගැන්වීම සඳහාත් සමාජ සංවිධානවල කාර්යයන් කාර්යක්ෂම කිරීම සඳහාත් කණ්ඩායම් සන්නිවේදය සාර්ථකව භාවිත කළ හැකිය.

අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය සතුව ද සුවිශේෂි බලයක් පවතී. යම් පුද්ගලයෙක් අන්තර්වර්ති සන්නිවේදන බලය ගොඩනගා ගන්නේ ඔහු ඇසුරු කරන පුද්ගලයන් හා සමාජයෙන් උකහා ගන්නා ධර්මතා වලිනි.

යම් පුද්ගලයක් සමාජයෙන් අපගාමී ධර්මතා අභ්‍යන්තරීකරණය කොටගෙන තම අන්තර්වර්ති සන්නිවේදන කුසලතා සකස් කරගත හොත් ඔහු සමාජ අපගාමී පුද්ගලයකු බවට පත්වේ. නමත් ධනාත්මක කුසලතා ඇසුරින් ස්වකීය අන්තර්වර්ති කුසලතා වර්ධනය කරගත් පුද්ගලයාට සමාජය විෂයෙහි යහපත් සබඳතා ගොඩනගා ගත හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 2.3 සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග

සමාජීය සහ ශුද්ධ විද්‍යා විෂයන් වල මූලික සංකල්ප පවතී. මූලික සංකල්ප මත එම විෂය ක්ෂේත්‍ර පදනම් වී ඇත. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳව විමසීමේ දී සන්නිවේදනය ක්‍රියාවලිය විධිමත් අයුරින් සිදුවීම සඳහා මූලික අංග කිහිපයක් ක්‍රියාත්මක වීම වැදගත්වේ. මෙම මූලික අංග මත සන්නිවේදන ක්‍රියාවලිය පදනම් වී තිබේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

සන්නිවේදකයා

සන්නිවේදකයා යනුවෙන් හඳුන්වන්නේ කිසියම් තොරතුරක්, පණිවිඩයක්, විස්තරයක්, සංකල්පනාවක්, අදහසක් වෙනත් අයෙකු වෙත පවසන / යවන /ලබා දෙන තැනැත්තායි. සන්නිවේදකයා පුද්ගලයකු, ආයතනයක්, කණ්ඩායමක් විය හැකිය.

සන්නිවේදකයන් විවිධ අයුරින් වර්ග කළ හැකිය. උදා: ගායකයන්, වාර්තාකරුවන්, නිවේදකයන් මාධ්‍ය ආයතන, ස්වේච්ඡා සංවිධාන.

මෙය තවදුරටත් නිදසුන් මගින් පැහැදිලි කලහොත්

සුනිමල් විසින් කමණිට පණිවිඩයක් යවයි. මෙහි පණිවිඩය යවන්නේ සුනිමල්ය. එබැවින් පණිවිඩය යවන තැනැත්තා වන සුනිමල් සන්නිවේදනයා ලෙස හඳුන්වනු ලැබේ.

ගමෙහි සුභසාධක සංගමයේ සාමාජිකයන් ගමේ පැතිරිගෙන යන ඩෙංගු රෝගය පිළිබඳව ගෙයින්ගෙට ගොස් ජනතාව දැනුවත් කරයි. මෙහි සන්නිවේදකයන් වන්නේ සුභ සාධක සංගමයේ සමාජීයක්ය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

ආකේතකරණය.

සන්නිවේදනයා තුළ ඇතිවන අදහසක්, ආලක්පයක්, සිතිවිල්ලක් තවකෙනෙකුට පැවැසීමට පෙර එය සංකේතයක්, රූපයක්, චිත්‍රයක් බවට පත් කර ඉදිරිපත් කරයි. මේ අයුරින් සන්නිවේදකයා තුළ ඇතිවන ආකල්ප, අදහස්, සිතිවිලි, රූපයක්, ලේඛනයක්, කවියක් බවට පත්කිරීමේ ක්‍රියාවලිය ආකේතකරණය නම්වේ. උදා: කමලා සුනිමල්ට ලබන සතියේ පැවැත්වෙන ඇයගේ උපන්දින සාදයට ආරාධනා කිරීමට සිතුවාය. ඉන් පසුව ඇය විසින් ආරාධනා පත්‍රයක අරාධනාව ලියා සුනිමල්ට යැවුවාය. මෙසේ කමලාගේ අදහස ලේඛණයක් බවට පත් කිරීම ආකේතකරණය නම්වේ.

පෙම්වතෙක් සිය පෙම්වතියට තම සිතැගි ප්‍රකාශ කිරීමට සිතුවේය. එහිදී ඔහු කවියකින් සිය අදහස කැටිකොට ඇයට පැවැසුවේය. මෙසේ පෙම්වතාගේ අදහස් කවියක් බවට පත්කිරීම ආකේතකරණය නම්වේ. හමුදා කණ්ඩායමක් අසල තිබෙන සතුරු කඳවුර පිළිබඳව මූලස්ථානය දැනුවත් කිරීමට සිතුවේය. ඉන්පසුව එම තොරතුර රහස් සංඥාවක් බවට පත්කර මූලස්ථානයට යැවුවේය. මෙසේ සිය තොරතුර රහස් සංඥාවක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය ආකේතකරණය නම්වේ.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>සන්දේශය</u>

සන්නිවේදකයා ග්‍රාහකයා වෙත යවන තොරතුර සන්දේශයයි. සන්දේශය අදහසක්, සංඥාවක්, සංකේතයක් වියහැකිය. එමෙන්ම සන්දේශය වාචිකව, නිර්වාචිකව, ලිඛිතව, අලිඛිතව යැවිය හැකිය. උදා: සරත් මයුරට ලිපියක් යවයි මෙහි සන්දේශය ලිපියයි.

පුවත්පත් වාර්තාකරුවකු පුවත්පතේ ලියන තීරුලිපියක් මගින් ජනතාව දැනුවත් කරයි. මෙහි සන්දේශය තීරුලිපියයි.

දේශපාලඥයා රූපවාහිනියෙන් කථාවක් කරමින් ජනතාව දැනුවත් කරයි. මෙහි දේශපාලඥයා කරන කථාව සන්දේශයයි.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>මාධ්‍ය / නාලිකාව</u>

සන්නිවේදකයෙක් ග්‍රාහකයා වෙත සන්දේශය ගෙන යන වාහකය මාධ්‍ය /නාලිකාව යනුවෙන් හඳුන්වයි. පුද්ගලයාගේ පංචේන්ද්‍රිය, දුරකථනය, ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත, මාධ්‍ය/නාලිකාව වශයෙන් හැඳින්වේ.

උදා: •සමන් තම අදහස් තවකෙකුට පවසයි. මෙහිදී මාධ්‍ය වන්නේ සමන්ගේ පංචේන්ද්‍රියයි.

පුවත්පත් කලාවේදියෙක් රටෙහි වත්මන් තත්ත්වය පිළිබඳව පුවත්පතට ලිපියක් ලියයි. මෙහි මාධ්‍ය වන්නේ පුවත් පතයි.

ගායකයෙකු ගුවන් විදුලියෙන් තම ගීතය ගායනා කරයි. මෙහි මාධ්‍ය/නාලිකාව වන්නේ ගුවන් විදුලියයි.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>ග්‍රාහකයා</u>

සන්නිවේදකයා යවන තොරතුරු ලබා ගන්නා තැනැත්තා ග්‍රාහකයා වශයෙන් හඳුන්වනු ලැබේ. විශාල ග්‍රාහකයන් පිරිසක් සිටිනම් ඔවුන් සියළුම දෙනාම ග්‍රාහක කේන්ද්‍රය වශයෙන් හඳුන්වයි. ග්‍රාහයකු යන්න පුද්ගලයකු පමණක් නොවේ ආයතනයක්, පිරිසක් විය හැකිය. මාධ්‍යයේ ස්වරූපය අනුව ග්‍රාහකයන් ද වෙනස් වේ.

පුවත්පතක ග්‍රාහකයා පාඨකයා වශයෙන් හඳුන්වයි. ගුවන්විදුලියක ග්‍රාහකයා ශ්‍රාවකයා වශයෙන් හඳුන්වයි. රූපවාහිනියේ / සිනමාවේ ග්‍රාහයකා ප්‍රේක්ෂකයා වශයෙන් හඳුන්වයි. උදා:

සුනිල් ගීතාට සිය ජංගම දුරකථනය ඔස්සේ පණිවිඩයක් යවයි. මෙහි ග්‍රහකයා වන්නේ ගීතාය.

පාසලේ ගුරු මණ්ඩලය පාසලේ උ.පෙල සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් පවත්වයි. මෙහි ග්‍රාහකයන් වන්නේ පාසලේ උ.පෙල සිසුන්ය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>විකේතකරණය.</u>

සන්නිවේදකයා ග්‍රාහකයාට ලබා දෙන සන්දේශය අක්ෂර, රූප, සංඥා, සංකේත වලින් සමන්විත වේ. එසේ සන්නිවේදකයා විසින් සංඥා, සංකේත, රූප බවට පත්කොට ග්‍රාහකයා වෙත එවන සන්දේශයේ අරුත ග්‍රාහකයා තේරුම් ගැනීමේ ක්‍රියාවලිය විකේතකරණය නම්වේ. මෙය තවත් ආකාරයකින් විග්‍රහ කළහොත් සන්දේශයක අන්තර්ගත වී ඇති සංඥා, සංකේත, රූප බවට පත්වූ අදහස් ග්‍රාහකයා තේරුම් ගැනීම විකේතකරණය නම්වේ.

උදා: මධුෂාන් ගීතාට සිය ජංගම දුරකථනය ඔස්සේ ඉංග්‍රිසි භාෂාවෙන් කෙටි පණිවිඩයක් යවයි. ගීතා ඉංග්‍රිසි භාෂාවෙන් ලැබුණු පණිවිඩය කියවා එහි අරුත සිංහල භාෂාවෙන් තේරුම් කර ගනියි. මෙසේ ඉංග්‍රිසි භාෂාවෙන් ලැබුණු පණිවිඩය සිංහලෙන් තේරුම් ගැනීම් විකේතකරණය නම්වේ.

හමුදා සෙබලෙක් සතුරු කඳවුරක් පිළිබඳ විස්තරයක් රූපසටහනක් ලෙස සිය හමුදා කඳවුරට යවයි. රූපසටහන මගින් පැවැසෙන පණිවිඩයේ අර්ථය හමුදා කඳවුරේ නිලධාරීන් තේරුම් ගනියි. මෙසේ රූපසටහන මගින් එවන ලද සන්දේශය අවබෝධ කර ගැනීම විකේතකරණය නම්වේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>ප්‍රතිපෝෂණය.</u>

සන්නිවේදකයා විසින් ග්‍රාහකයාට යවන ලද සන්දේශය ග්‍රාහකයා විසින් අවබෝධකර ගැනීමෙන් අනතුරුව ග්‍රාහකයා සන්නිවේදකයාට දක්වන නිරීක්ෂණය කල හැකි ආකාරයේ ප්‍රතිචාරය ප්‍රතිපෝෂණයයි. සන්නිවේදන ක්‍රියාවලියේ දී ප්‍රතිපෝෂණය ඉතාමත්ම වැදගත්වේ. ප්‍රතිපෝෂණය ධනාත්මක ප්‍රතිපෝෂණය සහ ඍණාත්මක ප්‍රතිපෝෂණය වශයෙන් වර්ග කළ අතර එය ක්ෂණික හා ප්‍රමාදී ප්‍රතිපෝෂණය වශයෙන් ද වර්ග කළ හැකිය.

උදා: මව විසින් විදෙස් ගත වී සිටින තම පුතුට අන්තර්ජාලයේ **Skype** තාක්ෂණය පණිවිඩ යවයි. මෙය තේරුම් කර ගන්නා පුතු මවට පිළිතුරු එවයි.

කථිකයා සභාව අමතා කථාවක් කරයි. එම කථාව අවබෝධ කර ගන්නා සභාවේ සිටින පිරිස ඔහුට අත්පොලසන් දෙයි.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>ඝෝෂා / බාධා</u>

සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර ඇතිවන සන්නිවේදන ක්‍රියාවලියට සිදුවන අවහිරතා සන්නිවේදන බාධා වශයෙන් හදුන්වනු ලැබේ. සන්නිවේදන බාධා වර්ග දෙකක් යටතේ වර්ග කළ හැකිය.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>මාධ්‍ය හාධක</u>

මාධ්‍ය බාධක යනු සන්දේශය රැගෙන යන නාලිකාවේ ඇතිවන බාධාවන්ය. නිදසුනක් ලෙස ජංගම දුරකථනය ඔස්සේ කථා කිරීමේ දී දුරකථනයේ සංඥා දුර්වලවීම නිසා සන්නිවේදන ක්‍රියාව ඇණ හිටීම, මුද්‍රිත මාධ්‍යයක රූප, වර්ණ, පාඨ දුර්වලවීම මත සන්දේශයේ අර්ථය වටහා ගත නොහැකි වීම.

උදා සුනිල් සතිඅන්ත පුවත්පතේ ඉතාමත්ම ආශාවෙන් කියවන විශේෂාංග ලිපිය පුවත්පතේ වර්ණ බොදවී තිබීම හේතුවෙන් එදින කියවීමට නොහැකිවීම.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>අර්ථ බාධක</u>

අර්ථ බාධක යනු සන්දේශයේ අර්ථය අවබෝධ කර ගත නොහැකි වීමයි. උදා

ඉංග්‍රිසි නොදත් අයෙකුට ඉංග්‍රිසි භාෂාවෙන් ලිපියක් යැවුවහොත් එහි අදහස තේරුගත නොහැකිවීම.

මෙයට අමතරව තවත් සන්නිවේදන බාධක කිහිපයක් පවතී.

පාරිසරික බාධා : දෙදෙනෙකු සන්න්වේදනයේ යෙදීමේ දී පර්සරයේ උෂ්නත්වය, අධික සීතල හේතුවෙන් සන්නිවේදන ක්‍රියාවලියට බාධා ඇතිවීම.

ශාරීරික බාධා : පුද්ගලයන් දෙදෙනෙකු සන්නිවේදනයේ යෙදීමේ දී සන්නිවේදකයා හෝ ග්‍රාහකයාගේ ශාරීරික අසනීප ත්ත්වයන් හේතුවෙන් සන්නිවේදන ක්‍රියාවලියට බාධා ඇතිවීම.

<u>අත්දැකීම් පසුතලය.</u>

සන්නිවේදකයක් සන්දේශයක් සකස් කර ගැනීමේ දී එම සන්දේශය සකස් කර ගැනීම සඳහා සන්නිවේදකයා ලත් අධ්‍යාපනය, ආර්ථික මට්ටම, ජීවත්වන පරිසරය ආදිය බලපායි. උදා:

විද්වතකුට සිය දේශනය පැවැත්වීම සඳහා උපකාරී වන්නේ ඔහු ලත් අධ්‍යාපනය, පරිශීලනය කළ පොත පත ආදියෙහි දැනුම වේ.

ආගමික නායකයෙන් සිය අනුගාමිකයන්ට ධර්මය දේශනා කිරීමේ දී එතුමාට උපකාරී වන්නේ එතුමා ලත් දහම් දැනුම, ඇසුරු කළ අනෙකුත් ආගමික නායකයන්ගේ අත්දැකීම් වලින් ලබාගත් දැනුමයි.

සන්නිවේදකයා සහ ග්‍රාහකයා සමාන සමාජ, සංස්කෘතික හා අධ්‍යාපන පසුබිමක සිටීනම් සන්නිවේදන ක්‍රියාවලිය පහසුවෙන් සිදු කළ හැකිවේ. උදා:

එකම විෂයක් හදාරන සිසුන් දෙදෙනෙකු විෂය ගැටලුවක් පිළිබඳව සාචිඡා කිරීමේ දී දෙදෙනාටම පසහුවෙන් කරුණු අවබෝධ කර ගත හැකිවීම.

<u>සන්දර්භය</u>

**සන්දර්භය යනුවෙන් හඳුන්වන්නේ සන්නිවේදනය සිදුවන පරිසරයයි. නිදසුනක් ලෙස පන්ති කාමරයේ දී යම් ශිෂ්‍යයකු ගුරුවරයකු සමග සිදුකරන සන්නිවේදනයට වඩා වෙනස් ආකාරයකින් පන්තිභාර ගුරුවරයා සමග සන්නිවේදනයේ යෙදෙයි. එසේම යම් නිලධාරියෙකු නිවසේ සමාජිකයන් සමග සන්නිවේදනය කරන ආකාරයට වඩා වෙනස් ආකාරයකින් වෘත්තීය ස්ථානයේ නිලධාරීන් සමග සන්නිවේදනයේ නිරත වේ.**

**සන්නවේදනය සිදුවන සන්දර්භයට නිදසුන් ලෙස පාසල් පරිසරය, ආගමික ස්ථාන, වෘත්තීය ස්ථාන, පවුල් සංස්ථාව, ස්වේච්ඡා සංවිධාන යන ආයතනවල සිදු වන සන්නිවේදන ක්‍රියා දැක්විය හැකිය. මෙම පරිසර වලදී එකම පුද්ගලයා විවිධ ආකාරයෙන් සන්නිවේදන කාර්යයයේ නිරත වේ.**

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

<u>බලපෑම</u>

**සන්නිවේදකයා යවන සන්දේශය හේතුවෙන් ග්‍රාහකයා තුළ ඇතිවන වෙනස්වීම බලපෑම නම් වේ. මෙහිදී සන්නිවේදකයා අපේක්ෂා කරන වෙනස්වීම ග්‍රාහකයා තුළ ඇති වුනි නම් සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වේ. උදා: මව සිය දරුවා තුළ චර්යාත්මක වෙනසක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් සිරිත් විරිත් කියාදීම.**

**අලෙවි කළමණාකරුවා තම නිෂ්පාදනයට පර්භෝගිකයන් පොලඹවා ගැනීමේ අපේක්ෂාවෙන් ජනමාධ්‍ය මගින් දැන්වීම් ප්‍රචාරය කිරීම.**

## <u>2.4 සන්නිවේදනය යනු කුමක් ද? (විද්වතුන්ගේ නිර්වචන ආශ්‍රයෙන්).</u>

**සන්නිවේදනය යනු සංකීර්ණ විෂය පථයකි. මෙම විෂයේ වර්ධනය පිළිබඳව විමසා බැලීමේ දී පසක් වන්නේ මෙම විෂය ආරම්භයේ සිටම වැඩී වර්ධනය වී ඇත්තේ අනෙකුත් සමාජීය සහ ශුද්ධ විෂයන් වල වල දැනුම තුලින් බවයි. විශේෂයෙන්ම සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලන විද්‍යාව, ගණිතය වැනි විෂයන් වල ආභාෂය සන්නිවේදන විෂය වර්ධනයවීම සඳහා ඉවහල් විය.**

**සන්නිවේදනය විෂය පථයේ ස්වරූපය, එහි ක්‍රියාකාරීත්වය, එහි ව්‍යුහය මැනවින් අවබෝධ කර ගැනීම උදෙසා මෙම විෂය විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් විසින් නිර්වචනය කර ඇති ආකාරය පිරික්සීම වැදගත්වේ.**

**1977 වර්ෂය වන විට සන්නිවේදනය පිළිබඳව ඉදිරිපත් කර තිබූ නිර්වචන 166ක් විශ්ලේෂණයට බඳුන් කල ස්විඩනයේ සන්නිවේදන විද්‍යාඥයකු වන කේ.මර්ටන් මෙසේ දක්වා ඇත. නිර්වචන 166න් නිර්වචන 75ක් සන්නිවේදනය ඒකීය/ඒකපාර්ශවීය ක්‍රියාවක් ලෙස දක්වා තිබුණි. නිර්වචන 64ක් සන්නිවේදනය සමමිතික ක්‍රියාවක් ලෙස දක්වා තිබුණි. නිර්වචන 21ක් කුමන හෝ වර්ගීකරණයකට බඳුන් කළ නොහැකි බව දක්වා තිබුණි.**

**මෙහිදී සන්නිවේදනය පිළිබඳව විවිධ ක්ෂේත්‍රවලට අයත් විද්වතුන්ගේ නිර්වචන කිහිපයක් විග්‍රහ කිරීම වැදගත්වේ.**

**හැරල්ඩ්.ඩී.ලැස්වෙල්(Harold D.Lasswell – 1948) ඔහුගේ The Structure and Function of Communication in Society නැමැති කෘතියේ සන්නිවේදනය මෙසේ හඳුන්වා ඇත.**

**"යම් කිසිවෙකු යම් කිසිවක් කිසියම් නාලිකාවකින් යම් කිසිවෙකුට කිසියම් බලපෑමක් කිරීම සඳහා ප්‍රකාශ කරනු ලබන දෙය සන්නිවේදනයයි".**

**මෙහි යම් කිසිවෙකු යන්නෙන් හඳුන්වන්නේ සන්නිවේදකයායි. යම් කිසිවක් යන්නෙන් හඳුන්වන්නේ සන්දේශයයි. කිසියම් නාලිකාවක් යනු සන්නිදේශය රැගෙන යන නාලිකාවයි. යම් කිසිවෙකුට යනුවෙන් ග්‍රාහකයා හඳුන්වයි. කිසියම් බලපෑමක් යනු සන්දේශය මගින් ග්‍රාහකයාට වන බලපෑමයි.**

**සන්නිවේදනය යන්න පිළිබඳව ශැනොන් සහ වීවර්ගේ(Shannon and Weaver, 1949) අදහස විශ්ලේෂණ කිරීම වැදගත්වේ.**

**"සන්නිවේදනය යනු යම් තැනැකදී නිර්මාණය කරගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන්ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීමයි" - The Mathematical Theory of Communication.**

**සන්නිවේදනය පිළිබඳව පර්යේෂණ සිදු කරන ලද විද්‍යාඥයකු වශයෙන් විල්බර්ශ්‍රාම් හැඳින්විය හැකිය. ඔහු විසින් සන්නිවේදනය පිළිබඳව දක්වා ඇති නිර්වචනය වැදගත් වේ - 1954**

**“තොරතුරු ගැබ්වූ සංඥාවක් කරන කොටගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන චිත්ත ස්වභාවයක් ඇතිවීම සන්නිවේදනයයි ”- Mass Communication: An Introduction U.S.A. 1986.**

**මෙයට අමතරව ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ සන්නිවේදනය විග්‍රහ කර ඇති ආකාරය පැහැදිලි කර ගැනීම වැදගත්වේ.**

**“අදහස් දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මගින් ප්‍රධානය කිරීම ප්‍රකාශ කිරීම හෝ හුවමාරු කර ගැනීම සන්නිවේදනයයි”.**

**ඉහත සියලු නිර්වචන පිරික්සීමේ දී පැහැදිලි වන්නේ සන්නිවේදනය යනු දෙපාර්ශවයක් අතර ඇති වන තොරතුරු හුවමාරුවක් යන්නයි.**

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J’Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

## 2.5 සන්නිවේදනයේ කාර්යයන්

**මානවයා පෘතුවියේ බිහි වූ මුල් කාලයේ සිටම සන්නිවේදනය ද විවිධ ආකාරයෙන් මානව ක්‍රියාකාරකම් සදහා ඉවහල් විය. එමෙන්ම අතීතයේ සරල මට්ටමක පැවැති සන්නිවේදනය මානවයාගේ පරිනාමයට සාපේක්ෂව ක්‍රමයෙන් වර්ධනය විය.**

**සමාජය විෂයෙහි සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී එහි හඳුනාගත හැකි කාර්යයන් කිහිපයක් විද්‍යාමානවේ. සන්නිවේදනයේ කාර්යයන් ද මානවයාගේ සමාජ ජීවිතය සංකීර්ණ වීමත් සමගම ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතී. සන්නිවේදනයේ කාර්යයන් අධ්‍යයනයේ පහසුව සදහා පහත ලෙස දැක්විය හැකිය.**

**තොරතුරු සම්පාදනය.**

**මානවයාට සමාජයේ ජීවත්වීමට තොරතුරු අවශ්‍ය වේ. එමෙන්ම සෙසු සමාජිකයන් සමග අන්තර් ක්‍රියා පවත්වා ගැනීමට, දැනුම වර්ධනය කර ගැනීමට තොරතුරු වැදගත්වේ.**

පුද්ගලයෝ තොරතුරු විවිධ සන්නිවේදන මාධ්‍ය මගින් ලබා ගනිති. උදා: සිසුවක් පොතපත පරිශීලනය කිරීමෙන් නව විෂය දැනුම පිළිබඳව තොරතුරු ලබා ගනියි. පුරවැසියකුට තමා ජීවත්වන පරිසරයේ සිදුවන සිදුවීම් පිළිබඳව ජනමාධ්‍ය ඔස්සේ තොරතුරු ලැබේ. වෘත්තිකයන්ට වෘත්තීය කරුණු පිළිබඳව දැනුම අන්තර්ජාලය පරිශීලනයෙන් සහ මුද්‍රිත මාධ්‍ය මගින් ලබා ගත හැකිය. මේ සියලු තොරතුරු සම්පාදන කාර්යය සඳහා සන්නිවේදනය මූලික වේ.

සමාජයේ තොරතුරු සම්පාදනය කරන මූලාශ්‍ර තිබේ. ජනමත නායකයන්, ජනමාධ්‍ය ආයතන, ගුරුවරුන්, විවිධ ක්ෂේත්‍ර වල බුද්ධිමතුන්, ආගමික නායකයන් මෙහිලා වැදගත් වේ.

පුද්ගලයන් තමන්ට අවශ්‍ය තොරතුරු මෙම මූලාශ්‍ර මගින් ලබා ගනියි. වෙනත් අයෙකුගෙන් තොරතුරු ලබා ගැනීමේ දී ඔවුන් සමග මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම වැදගත්වේ. මේ සඳහා පුද්ගලාන්තර සන්නිවේදන සබඳතා උපයෝගී කර ගත හැකිය.

තොරතුරු සම්පාදය සඳහා සන්නිවේදන වර්ග ඉවහල් වන ආකාරය.

උදා : දුම්රිය ස්ථානාධිපතිවරයකු දුම්රිය පැමිණෙන වෙළාවන් පිළිබඳව මගියෙකු දැනුවත් කිරීම - පුද්ගලාන්තර සන්නිවේදය.

එලවළු වෙළෙන්දෙක් එළවළු මිල ගණන් පිළිබඳව තොරතුරු පාරිභෝගිකයකුට පැවැසීම - පුද්ගලාන්තර සන්නිවේදනය.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

බැංකු කළමණාකරුවක් බැංකු ගිණුමක් පිළිබඳ තොරතුරු පුද්ගලයකුට විස්තර කිරීම -

පුද්ගලාන්තර සන්නිවේදනය.

දේශපාලඥයෙක් රැස්වීමක දී තම දේශපාලන මතය ප්‍රදේශයේ ජනතාවට පැවැසීම- මහජන සන්නිවේදනය.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>උපදෙස් සම්පාදනය / අධ්‍යාපනය.</u>

උපදෙස් සම්පාදනය යනු තොරතුරු සම්පාදනයේ වර්ධනීය අවස්ථාවකි. උපදෙස් සම්පාදනය ධනාත්මක සහ සෘණාත්මක ආකාරයෙන් සමාජයේ ක්‍රියාත්මක වේ. ධනාත්මක උපදේශනය මගින් පුද්ගල චර්යාවන් වර්ධනය වන අතර සෘණාත්මක උපදේශනය මගින් අපගාමී පෞරුෂයන් පුද්ගලයන් තුළ ගොඩනැගේ.

උපදෙස් සම්පාදනය / අධ්‍යාපනය සම්පාදය සඳහා සන්නිවේදන ඉවහල් වන ආකාරය.

උදා කෘෂි උපදේශකයන් විසින් විරැකියාවෙන් පෙලෙන තරුණයන්ට ස්වයං රැකියා සඳහා උපදෙස් ලබා දීම – කණ්ඩායම් සන්නිවේදනය.

කෘෂි කාර්මික කටයුතු වල යෙදෙන ගොවියෙකුට ගොවි නියාමකවරයක් විසින් උපදෙස් ලබාදීම – පුද්ගලාන්තර සන්නිවේදනය.

මානසික ගැටලු සඳහා මනෝ වෛද්‍යරුන් විසින් මනෝවිද්‍යාත්මක උපදෙස් ලබාදීම- කණ්ඩායම් සන්නිවේදනය.

උපදේශන ලබාදීමේ දී මූලිකව සිදු වන්නේ පුද්ගලයා දැනුවත් වීමකි. නොවසේ නම් ඔහුට අධ්‍යාපනය ලබා දීමකි. උපදේශනය සාර්ථකව සිදුවීම සඳහා උපදේශකයා සහ උපදේශය ලබා ගන්නා අතර ඇති වන සුහදත්වය වැදගත්වේ. එමෙන්ම දෙදෙනා අතර ඇතිවන විශ්වසනීයත්වය ද මෙහි දී වැදගත්වේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

සමාජය තුළ සෘණාත්මක ආකාරයෙන් ද උපදේශනය ක්‍රියාත්මක වේ.

උදා

පාසල් සිසුන් මත්ද්‍රව්‍ය වලට පොලඹවා ගැනීම උදෙසා සිදු වන වැරදි උපදේශනයන් අන්තර්ජාලය හරහා ලබාදීම – අථත්‍ය සන්නිවේදනය

මේ අනුව සමාජයේ සහ පුද්ගලයාගේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුවන උපදේශනය වැදගත්වේ.

<u>පෙලඹවීම.</u>

සමස්ත සන්නිවේදන ක්‍රියාවලියම පදනම් වී ඇත්තේ පෙලඹවීම මතයි. සන්නිවේදනයේ අරමුණ වන්නේ පෙලඹවීමක් ඇති කිරීමයි. පෙලඹවීම විවිධ ආකාරයෙන් සිදුවිය හැකිය. යම් කිසිවෙකු අනෙකෙකුගේ මතයක් පිළිගැනීම සඳහා යොමු කිරීම පෙලඹවීම යනුවෙන් හැඳින්වේ. පහසුවෙන්

ඉක්මණින් පෙලඹවීම සඳහා නිර්මාණශීලීව සන්දේශය ඉදිරිපත් කිරීම වැදගත් වේ. ලිඛිතව හෝ වාචිකව යමක් පිළිගන්නා ලෙස තවකෙකුට පැවසීමට වඩා එය කවියකින්, චිත්‍රයකින්, නිසදැසකින් ඉදිරිපත් කළ හොත් ඒ සඳහා සිදුවන පෙලඹීමේ ශක්‍යතාවය වැඩිවේ. වර්තමානයේ දී අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් පොලඹවා ගැනීමට විවිධ ඉගැන්වීමේ ක්‍රමවේද හදුන්වා දී තිබේ.

පොලඹවා ගැනීමේ ක්‍රියාවලිය ධනාත්මකව සහ ඍණාත්මකව සිදුවිය හැකිය.

උදා

ළමුන් සනිපාරක්ෂක පුරුදු සඳහා පොලඹවා ගැනීමට නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම භාවිතා කිරීම ( උදා: රූප සටහන්, වර්ණවත් වදන්).

අලෙවිකරුවන් තම නිෂ්පාදන සඳහා පාරිභෝගිකයන් පොළඹවා ගැනීමට ජනමාධ්‍ය මගින් දැන්වීම් විකාශය කිරීම.

ගොවියන් කාබනික පොහොර භාවිතය සඳහා පොලඹවා ගැනීමට කෘෂි උපදේශකවරු සම්මන්ත්‍රණ, සාකච්ඡා පැවැත්වීම.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පොළඹවා ගැනීමට සමාජ මාධ්‍ය භාවිත කිරීම(උදා: නිර්මාණශිලි වදන්, වර්ණවත් ඡායාරූප).

ඉහත පොලඹවා ගැනීමේ ක්‍රියාවලිය තුළ සන්නිවේදනය ලිඛිතව, අලිඛිතව, වාචිකව, නිර්වාචිකව භාවිත වන බව විද්‍යාමාන වේ.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.**
**Voice : 0711715342**

විනෝදාස්වාද සම්පාදනය.

පුද්ගලයාගේ වැදගත් කාර්යයක් වශයෙන් විනෝදාස්වාදය සඳහා යොමුවීම දැක්විය හැකිය. මානව සම්භවයේ මුල් යුගයේ සිටම විනෝදාස්වාදය සඳහා සන්නිවේදනය භාවිත කර තිබෙන බව ඓතිහාසික රූප, ගල්ගුහා වල තිබෙන සිතුවම්, වැයීම සඳහා භාවිත කර තිබෙන පැරැණි වාද්‍ය භාන්ඩ නිරීක්ෂණය කිරීමේ දී ගම්‍යවේ. එමනිසා විනෝදාස්වාදයේ පදනම සන්නිවේදනය වශයෙන් හැදින්විය හැකිය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයින් ස්වකීය විනෝදාස්වාදය සඳහා එක් රැස්වී සතුන්ගේ අභිනයන් රඟ දැක්වීය. රේඛා රූප මර්ගයෙන් චිත්‍ර කර්මවල නිරත විය. සතුන්ගේ විවිධ ශබ්ද අනුකරණය කළෝය. මේ සියල්ලම සඳහා මූලික වූයේ නිර්වාචික, වාචික, ලිඛිත සහ අලිඛිත සන්නිවේදනයයි.

මුද්‍රිත මාධ්‍යයේ වර්ධනයත් සමගම පුද්ගලයා විනෝදාස්වාදය සඳහා ලිඛිත සන්නිවේදනය භාවිතා කළේය. ඒ අනුව කවි, නිසදැස්, නවකථා, කෙටිකථා වැනි ලිඛිත සන්නිවේදන ක්‍රම බිහිවිය.

19 සියවසෙන් පසුව මානවයා කාර්මික වශයෙන් දියුණු විය. ඒ අනුව විනෝදාස්වාදය සඳහා නව තාක්ෂණික මෙවලම් පෙලක් බිහිවිය. රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත් මේ අතරින් විශේෂ වේ. මේවායින් විටක විනෝදාස්වාදය පමණක් ලබා දෙන අතර, තවත් විටක අධ්‍යාපනය සමග විනෝදාස්වාදය ලබා දෙයි.

**Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya. Voice : 0711715342**

තාක්ෂණයේ වර්ධනයත් සමගම වර්තමානය වන විට අන්තර්ජාලය පුමුඛකරගත් සමාජ මාධ්‍ය මගින් පුද්ගලයා දැනුම සහ විනෝදාස්වාදය ලබා ගනියි.

විනෝදාස්වාදය සඳහා සන්නිවේදනය ඉවහල් වන ආකාරය පහත නිදසුන් මගින් තව දුරටත් විස්තර කළ හැකිය. උදා

සතිඅන්ත පුවත්පත් වල විශේෂාංග ලිපි, රසකථා, ඕපාදූප, ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ජීවිතයේ රස මුසු තැන් පිළිබඳව විස්තර කියවා පුද්ගලයන් ආශ්වාදයක් ලබා ගැනීම.

පාඨකයෝ නවකථා සහ කෙටිකථා කියවීමෙන් විනෝදය ලබා ගැනීම.

පුද්ගලයෝ වේදිකා නාට්‍ය, චිත්‍රපට නැරඹීමෙන් විනෝදය ලබා ගැනීම.

පුරාණ ගම්මාන වල කඩමංඩිය, ළිද අසල, නාන තොටුපල වැනි ස්ථාන වල දී පුද්ගලයන් රස කථා කියමින් සතුටුසාමීචියේ යෙදීම.

අතීතයේ ගම්මාන වල කවිකොළ කාරයින්, විරිදු කරුවන් විසින් රටේ සිදුවූ ආන්දෝලාත්මක සිදුවීම් පිළිබඳ විස්තර ප්‍රසිද්ධ ස්ථානවල දී කාව්‍යාත්මකව අභිනයෙන් ඉදිරිපත් කිරීම සහ ඒවා නරඹා ගැමියන් දැනුම සමග විනෝදාස්වාදයක් ලැබීම.

සම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම( උදා සොකරි, කොලම්) වල විනෝදය මුසු දැනුම අන්තර්ගතවීම.

අතීතයේ සිට පුද්ගලයන් භාවිත කරන විනෝදාස්වාද ක්‍රම විශ්ලේෂණ කිරීමේ දී ගම්‍යවන්නේ ඒවා තුළ කුමණ හෝ සන්නිවේදන ක්‍රමවේදයක් අන්තර්ගතවී තිබෙන බවයි.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>සුපරීක්ෂණය</u>.

සුපරීක්ෂණය යනු සමාජය පිළිබඳව අවදියෙන් සිටීමයි. මානව සමාජය නිශ්චලව ඉදිරියට ගලා නොයයි. සමාජය තුළ විවිධ වූ ගැටුම් පුද්ගල සබඳතා බිදවැටීම් ආදිය සිදු විය හැකිය. මෙවැනි අවස්ථා වලදී මේ සම්බන්ධයෙන් පුද්ගලයන් දැනුවත් කිරීමටත් ඔවුන්ට අවබෝධය ලබා දීමටත් සන්නිවේදනය උපයෝගී කරගත හැකිය.

සමාජයේ පුරවැසියන් තුළ ඇතිවන භේද භින්නතා, සමාජ පැවැත්මට හානි දායක වන මනුෂ්‍ය ඝාතන, සොරකම්, ත්‍රස්තවාදී ක්‍රියාකාරීත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත් ඒ පිළිබඳව සමාජයේ නීතිය බලාත්මක කරන ආයතන අවධිකිරීමත් වර්තමානයේ ජනමාධ්‍ය මගින් සිදුවේ.

උදා: අධික වර්ෂා සමයේ දී ඇතිවන ගංවතුර, නායයෑම් පිළිබඳව අවධියෙන් සිට පූර්ව දැනුවත් කිරීම් ජනමාධ්‍ය මගින් සිදු කිරීම.

රජ්‍ය ආයතන වල සිදුවන අක්‍රමිතා පිළිබඳව ජනමාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීම.

ජනතාව මුලාවට පත් කරන ව්‍යාපරිකයන් වංචාකාරයින් පිළිබඳව සමාජය දැනුවත් කිරීම.

විශේෂයෙන්ම සුපරික්ෂණය බහුල වශයෙන් සිදු වන්නේ ජනමාධ්‍ය මගිනි. සමාජයේ සහජීවනය පවත්වා ගෙන යාම සහ සමාජයේ සාර ධර්ම හරපද්ධති ආරක්ෂා කර ගැනීම සදහා සුපරීක්ෂණය වැදගත්වේ.

Udaya Amaraweera, University visiting lecturer. BA University of J'Pura, MA & M.Phil in Mass.Com, University of Kelaniya.
Voice : 0711715342

<u>අර්ථකථනය.</u>

සන්නිවේදනයේ වැදගත් අංගයක් නම් අර්ථකථනයයි. අර්ථකථනය යනු තොරතුරක්, සන්දේශයක් මැනවින් පැහැදිලිකර ගැනීමයි. නැතහොත් යම් තොරතුරකින් සන්දේශයකින් කියවෙන අර්ථය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලියයි. නිදසුන් ලෙස අධ්‍යාපන කාර්යයේ දී

සිසුවකුට තමා ඉගෙන ගන්නා විෂය කරුණු වඩාත් හොදින් පැහැදිලි කර ගැනීම සඳහා ගුරුවරයාගේ පැහැදිලි කිරීම වැදගත්වේ. මෙම පැහැදිලි කිරීමේ කාර්යය අන්තර් පුද්ගල සන්නිවේදනය ඔසසේ වඩාත් හොදින් සිදු කළ හැකිය.

පුද්ගලයෙක් සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී එකිනෙකාගේ අදහස් වඩාත් හොදින් අවබෝධ කරගැනීම සඳහාත්, පවතින සබඳතාවය ශක්තිමත් කර ගැනීම සඳහාත්, පුද්ගලාන්තර සන්නිවේදනය වැදගත්වේ.

කුඩා දරුවෙකු සමාජයේ පවතින සිරිත් විරිත් වලට හැඩගැස්වීමේ ක්‍රියාවලිය ස්වකීය මව සමග ඇතිවන පුද්ගලාන්තර සබඳතාවය මගින් සිදුවේ. එමෙන්ම ගුරුවරයකු ඉගැන්වූ විෂය කරුණක් පැහැදිලි කර ගැනීම සඳහා උගත් වැඩිහිටියකුගේ සහය අවශ්‍ය වේ.

මෙයට අමතරව ජනමාධ්‍ය මගින් ද ලබාදෙන සන්දේශ නිවැරදිව සහ විස්තරාත්මකව පැහැදිලි කර ගැනීම සඳහා යමෙකුට ජනමත නායකයකුගේ( උදා ගුරුවරයකු, ආගමික නායකයකු) සහය අවශ්‍ය විය හැකිය.

පුද්ගලයන් සමාජයේ ජීවත් වීමේ දී තොරතුරු අදහස් ආකල්ප මැනවින් අවබෝධ කර ගැනීම සඳහා අර්ථකථනය වැදගත් වන අතර එහි සාර්ථකත්වය සන්නිවේදනය මත පදනම් වේ.

<u>සහසම්බන්ධය.</u>

සමාජයේ විවිධ පුදගලයන් වෘත්තිකයන් ආගමික නායකයන් ගුරුවරුන් දාර්ශනිකයන් විවිධ ක්ෂේත්‍ර වලට අයත් විදවතුන් ජීවත් වේ. මොවුන් සියළු දෙනාම සමාජයේ විසිරී ජීවත් වේ. සමාජයේ ප්‍රගමණය සඳහා මේ සියළු දෙනාගේ අදහස් ආකල්ප මවතාද උපදෙස් අවශ්‍ය වේ. ගැටලුකාරී අවස්ථාවන්හි දී ඔවුන්ගේ උපදෙස් අවසි වේ. උපදෙස් අවශ්‍ය වූවන්ට අවශ්‍ය අවස්ථාවන් වලදී උපදෙස් ලබා ගැනීම සඳහා දෙපාර්ශවය අතර සම්බන්ධයක් ජන මාධ්‍ය මගින් ගොඩ නැගිය හැකිය.

මෙය තවදුරටත් පැහැදිලි කළහොත් ගමෙහි කෘෂි සමිතිය මගින් ගමෙහි වැව පිළිසකර කර ගැනීම සඳහා ශ්‍රම දානයක් පැවැත්වීමට අපෙක්ෂා කෙරේ. මේ සඳහා ගමේ ජනමත නායකයන් වන පන්සලේ නායක ස්වාමින් වහන්සේ, ග්‍රාම නිලධාරී මහතා, ගොවි මහතුන් වැනි පුද්ගලයන් එකම සාකච්ඡා මේසයකට කැදවා ඉදිරි කටයුතු සඳහා සැලසුමක් සකස් කළ යුතුය.

මෙම ක්‍රියාවලිය ඉදිරියට සිදු කර ගෙන යෑම සඳහා එකිනෙකා අතර ඇතිවන අන්‍යෝන්‍ය සම්බන්ධය වැදගත්වේ. මෙහිදී එකිනෙකා අතර සම්බන්ධතාවය ගොඩ නැගීම සඳහා කණ්ඩායම් සන්නිවේදනය භාවිතා කළ හැකිය.

යම් වෘත්තීය ස්ථානයක් යම් අරමුණක් ඉටුකර ගැනීමට ක්‍රියා කිරීමේ දි එම වෘත්තීය ස්ථානයේ සිටින සියළුම දෙනා එකම අරමුණක් වෙත ඒකරාශි කොට ඔවුන් තුළ උනන්දුවක් ඇති කළ යුතුය. අපේක්ෂිත අරමුණ හඹා යෑම සඳහා එකිනෙකා අතර උනන්දුව ඇති කිරීම සඳහා කණ්ඩායම් සන්නිවේදනය භාවිත කළ හැකිය.

කුඩා දරුවෙකු පුවල් පරිසරය, පාසල් පරිසරය, මිතුරු සමූහ වලට හුරුකිරීමේ දී පුද්ගලාන්තර සන්නිවේදනය කණ්ඩායම් සහ සන්නිවේදනය ජනසන්නවේදනය උපකාරී වේ.

<u>සමාජානුයෝජනය.</u>

සමාජායුයෝජනය යනු සමාජයට මුසුවීමයි. සමාජය විවිධ සමාජ සංස්ථා වලින් සමන්විත වෙයි. ඒවා නම් පවුල් සංස්ථාව, අධ්‍යාපනික සංස්ථාව, ආගමික සංස්ථාව හා දේශපාලනික සංස්ථාවයි. මෙම සමාජ සංස්ථා සමග සම්බන්ධතා පැවැත්වීම සමාජානුයෝජනය නම්වේ. මෙම සමාජ සංස්ථා සමග සම්බන්ධතා පැවැත්වීමේ දී එක් එක් සමාජ සංස්ථා වලට අයත් සාජිකයන් සමග සන්නිවේදනය කිරීමට සිදුවේ. යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා යහපත් සන්නිවේදනයක් අවශ්‍යවේ.

පවුල් සංස්ථාව ගත හොත් පවුල් සංස්ථාවේ සමාජිකයන් වන මව, පියා, සහෝදරසහෝදරියන් සමග යහපත් සම්බන්ධයක් ගොඩ ගනා ගැනීමට දරුවකු ඔවුන් සමග හොදින් පුද්ගලාන්තර සන්නාවේදනයේ යෙදිය යුතුය. එතුළින් ඔවුන්ගෙන් සිරිත් විරිත් හර පද්ධති පිළිබඳව ඉගෙන ගැනීමට හැකිවේ.

අධ්‍යාපන සංස්ථාව ද එසේමැයි. අධ්‍යාපන සංස්ථාවට ගුරුවරුන් අයත් වේ. ශිෂ්‍යයෙක් ගරුවරයකු සමග යහපත් සබඳතාවයක් ගොඩනගා ගැනීම සඳහා යහපත් පුද්ගලාන්තර සන්නිවේදනයක් ගොඩ ගනා ගැනීම වැදගත්වේ.

සමවයස් සමූහ, මිතුරු සමූහ ද එසේමැයි. නවක මිතුරෙකු සම වයසේ මිතුරන් සමග මුසුවීමේ දී එකිනෙකා පිළිබඳවිශ්වාසයක් පැහැදිලිතාවයක් ඇති කර ගැනීම අවශ්‍ය වේ. එම අවබෝධය ගොඩනගා ගැනීම සඳහා කණ්ඩායම් සන්නිවේදනය වැදගත්වේ.

වෘත්තීය පරිසරවලදී එනම් කාර්යාලයක ආයතනයක එකානෙකා සමග යහපත් සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීම සඳහාත්, දැනුම හුවමාරු කර ගැනීම සඳහාත්, පුද්ගලාන්තර සන්නිවේදනය, කණ්ඩායම් සන්නිවේදනය වැදගත්වේ.

ආගමික සංස්ථාව තුළ ස්වාමින් වහන්සේලා, පූජකවරුන් සිටියි. මෙම උතුමන් සමග සම්බන්ධතාවයන් ගොඩ නගා ගැනීම සඳහාත්, ඔවුන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීම සඳහාත්, පුද්ගලයකුට පුද්ගලාන්තර සන්නිවේදනය වැදගත්වේ. මෙයින් පැහැදිලිවන්නේ සමාජානුයෝජන කාර්යයයේ දී පුද්ගලාන්තර සන්නිවේදනය වැදගත් බවයි.